(ආ) ඔබ සන්නද්ධ සේවාවක සේවය කර ඇත් ද ? එසේ නම් අස්වීමේ දී දෙන ලද සහතිකයේ ඡායා පිටපතක් අමුණන්න :———.

17. (අ) ඔබ සන්නද්ධ ස්වේච්ඡා සේවයට අනුයුක්තව සිටින්නේ ද ? එසේ නම් අයදුම්පත හමුදා ප්‍රධානියාගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. :———.
(ආ) ඔබ සන්නද්ධ ස්වේච්ඡා සේවයෙහි අනුයුක්තව සිටියේ ද ? එසේ නම් අස්වීමේ දී දෙන ලද සහතිකයේ ඡායා පිටපතක් අමුණන්න. :———.

18. ඔබ කිසියම් වරදක් සම්බන්ධයෙන් හෝ සැකපිට අත් අඩංගුවට ගෙන තිබේ ද ? එසේම යම් වරදක් සම්බන්ධයෙන් චෝදනා ලැබ හෝ උසාවියට කැඳවනු ලැබ හෝ දඬුවම් ලැබ හෝ ඇත් ද ? (එසේ නම් විස්තර සඳහන් කරන්න) :———.

19. ඔබගේ කිසියම් ඥාතියෙකු යම් වරදක් සම්බන්ධයෙන් හෝ සැකපිට අත් අඩංගුවට ගෙන තිබේ ද ? එසේම යම් වරදක් සම්බන්ධයෙන් චෝදනා ලැබ හෝ උසාවියකට කැඳවනු ලැබ හෝ දඬුවම් ලැබ ඇද්ද ? එසේ නම් විස්තර සඳහන් කරන්න :———.

ඉහත කරුණු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි ඒවා බවට මින් සහතික කරමි. එසේම ඉහත දැක්වූ තොරතුරු වැරදි හා අසත්‍ය ඒවා බවට හෙළිවුවහොත් මා සේවයට පත්කර ගෙන ඇතත් ඕනෑම අවස්ථාවක දී ශ්‍රී ලංකා පොලීසියේ සේවය වහාම නතර කිරීමට යටත් වන බව දනිමි.

———.
අයදුම්කරුගේ අත්සන.

දිනය :———.

20. දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය : (අදාළ නම් පමණි)

මෙම අයදුම්පත ඉදිරිපත් කරන ......................... මයා/ මිය/මෙනවිය ................... දෙපාර්තමේන්තුවේ/ සංස්ථාවේ/ මණ්ඩලයේ සේවයේ නියුතු අයෙකු බවත් ඔහු/ඇය මෙම තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් සේවයෙන් මුදා හැරිය හැකි බවත් ප්‍රකාශ කරමි.

———,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන
සහ නිල මුද්‍රාව.

තනතුර :———.

දිනය :———.

06-957/1

---

**ශ්‍රී ලංකා පොලීසිය**

පොලිස් කොස්තාපල් තනතුර (රාජ්‍ය බුද්ධි සේවාව)

ශ්‍රී ලංකා පොලීසියේ රාජ්‍ය බුද්ධි සේවාවට ඍජුවම බඳවා ගැනීම සඳහා ආධුනික පොලිස් කොස්තාපල් තනතුරට ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. පහත දක්වනු ලබන ආකෘති පත්‍රය අනුව සකස් කරන ලද අයදුම්පත් අධ්‍යක්ෂ, බඳවා ගැනීම්, ආධුනිකයින් බඳවා ගන්නා කොට්ඨාසය, අංක 375, පළමු මහල, ශ්‍රී සම්බුද්ධත්ව ජයන්ති මාවත, කොළඹ 06, යන ලිපිනයට එවිය යුතු ය. අයදුම්පත් බහා එවනු ලබන කවරයේ වම් කෙළවරේ ඉහලින් තමා අයදුම්කරන තනතුර සඳහන් කර එය ලියාපදිංචි තැපෑලෙන් 2019.08.30 වැනි දිනට හෝ ඊට පෙර ඉහත සඳහන් ලිපිනයට ලැබීමට සැලැස්විය යුතු ය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් සම්බන්ධයෙන් ක්‍රියා නොකරනු ලබන අතර ශ්‍රී ලංකා පොලීසිය විසින් අයදුම්පත් නිකුත් කරනු නොලැබේ.

03. *වැටුප් ක්‍රමය* :

රු. 3,54,480 - 7 x 3,600 - 27 x 4,440 - රු. 4,99,560.00

2016.01.01 වැනි දින සිට ගෙවීම් කරනු ලබන්නේ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 3-2016 හි 11 වන උපලේඛනය අනුව වේ. මෙම වැටුප් පරිමාණයන් පූර්ණ වශයෙන් ක්‍රියාත්මක වන්නේ 2020.01.01 වැනි දින සිටය.

තවද මෙම නිලධාරීන් 2013.01.07 වැනි දිනැති පොලිස්පති චක්‍රලේඛ අංක 2416/2013 යටතේ ලබා දී ඇති දීමනාවලට ද හිමිකම් ලබයි. ඉහත සඳහන් වැටුප් පරිමාණයට අමතරව මෙහි පහත සඳහන් දීමනා ඔවුන් වෙත මාසිකව හිමිවනු ඇත.

| | | |
|---|---|---|
| (අ) | ජීවන වියදම් දීමනාව | රු. 7,800 0 |
| (ආ) | රා.ප.ච.03/2016 අනුව තනතුරට අදාළ 40% දීමනාව | රු. 10,595 0 |
| (ඇ) | වැටුපෙන් 25% ක දීමනාව | රු. 6,622 0 |
| (ඈ) | දුෂ්කර දීමනාව | රු. 2000 0 |
| (ඉ) | දිරි දීමනාව | රු. 800 0 |
| (ඊ) | නිල ඇඳුම් පිරිසිදු කිරීමේ දීමනාව | රු. 250 0 |
| (උ) | සිවිල් ඇඳුම් දීමනාව | රු. 200 0 |
| (ඌ) | සංයුක්ත දීමනා (උපරිම විශේෂ දීමනා ගෙවනු ලබන ප්‍රදේශ සඳහා) | රු. 10,500 0 |
| (එ) | සංයුක්ත දීමනා (උපරිම/ විශේෂ දීමනා ගෙවනු නොලබන ප්‍රදේශ සඳහා) | රු. 9,800 0 |

*මෙම දීමනාවලට අමතරව* -

(අ) නොමිලේ ගමන් පහසුකම්,
(ආ) නිලධාරීන්ට නොමිලේ වෛද්‍ය පහසුකම් (විදේශ රටක දී වුවද ප්‍රතිකාර කිරීමට මුදලින් ආධාර ලබා ගත හැකිය.)
(ඇ) සියලුම නිල ඇඳුම් නොමිලේ සපයනු ලැබේ.
(ඈ) තමාගේ ක්‍රීඩා කෞශල්‍යය හා සහජ හැකියාවන් දියුණු කර ගැනීමේ පහසුකම්.
(ඉ) රාජකාරි සඳහා ගමන් වියදම් ද, දුෂ්කර සේවය හා විශිෂ්ට රාජකාරි සඳහා තෑගි වශයෙන් මුදල් ද ප්‍රදානය කරනු ලැබේ.
(ඊ) තෝරාගන්නා අයදුම්කරුවන් සාමාන්‍ය ඇඳුමින් සැරසී රාජකාරී කළයුතු අතර, මෙරට හා පිටරට පුහුණුව ලැබීමට සුදානම් විය යුතුය.

04. *අවශ්‍ය මූලික සුදුසුකම්* :

(අ) *වයස් සීමාව* :
*ගැසට්* නිවේදනය අනුව අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 18-28 ත් අතර විය යුතු ය. එසේ වුවද දැනට ශ්‍රී ලංකා පොලීසියේ රාජකාරියේ නියුතු පොලිස් කොස්තාපල් රියදුරන්ට අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 30 දක්වා අයදුම්කළ හැකිය.

(ආ) *අධ්‍යාපන සුදුසුකම්* :
අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් ගණිතය හා මාධ්‍ය භාෂාව ඇතුළුව දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් 06ක් සමත් විය යුතුය. වාර දෙකක දී සාමාර්ථය ලබන අයදුම්කරුවෙකු ප්‍රථම වාරයේදී විෂයයන් 05ක් සමත් විය යුතුය. (විෂයයන් 05 ඇතුළත ගණිතය හෝ මාධ්‍ය භාෂාව යන විෂයයන් දෙකම හෝ ඉන් එකක් හෝ සමත් විය යුතුය)

***සටහන 01***: ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ විෂයය වර්ගී-කරණය අනුව විෂයය අංක 41, 44 දරන විද්‍යා විෂයය යුගලය එක් විෂයයක් ලෙස ද, අංක 42 සහ 45 දරන ගණිතය විෂය යුගලය එක් විෂයයක් ලෙස ද, සලකා විභාගයෙන් සමත් විෂයය සංඛ්‍යාව තීරණය කරනු ලැබේ.

***සටහන 02*** : අ.පො.ස (සා. පෙළ) විභාගයේ තාක්ෂණ විෂයය ලිඛිත පරීක්ෂණයෙන් අසමත්වීම එම විෂයයේ ප්‍රායෝගික පරීක්ෂණය සමත් වුව ද එම විෂයය අසමත් ලෙස සලකනු ලැබේ.

***සටහන 03*** :වෛකල්පිත දෙමළ, ඉංග්‍රීසි සහ සිංහල විෂයය අ.පො.ස. (සා. පෙළ) විෂයය ධාරාවට ඇතුළත් නොවන හෙයින් එම විෂයයන් සමත්වීම අ.පො.ස (සා. පෙළ) විභාගයෙන් සමත් විෂයයක් ලෙස ගණනය කරනු නොලැබේ.

(ඇ) *ශාරීරික සුදුසුකම්* :

- උස අඩි 05 යි. අඟල් 04 යි. (අවම),
- පපුව අඟල් 30 (අවම/හුස්ම නාල්ලා).

***සටහන*** : විශිෂ්ට ක්‍රීඩා කෞශල්‍යයකින් යුක්තවූත් ජාතික ක්‍රීඩා සංචිතයක සිට ජාතික මට්ටමේ ක්‍රීඩාවල දී විශිෂ්ටත්වයක් දක්වා ඇති හෝ ජාත්‍යන්තර තරගයකට සහභාගි වී ශ්‍රී ලංකාවට කීර්තියක් අත්කර දුන් අයදුම්කරුවෙකුගේ ශාරීරික සුදුසුකම් මඳක් අඩු වුව ද අනෙක් සුදුසුකම් සපුරා ඇතිනම් පොලිස්පතිගේ අභිමතය පරිදි බඳවා ගැනීම සඳහා සුදුසුකම් ලබයි.

(ඈ) *දෘෂ්ටිය පිළිබඳ අවශ්‍යතාවයන් .*— එක් ඇසක දෘෂ්ටිය 6/12ට අඩු නොවිය යුතු ය. දෘෂ්ටිය එක් ඇසක 6/6 සහ අනෙක් ඇසෙහි 6/18 වේනම් එය ද පිළිගනු ලැබේ. වර්ණ දෘෂ්ටිය සාමාන්‍ය විය යුතු ය. යම් අයදුම්කරුවෙකු උපැස් යුවලක් හෝ ස්පර්ශකාච පාවිච්චි කරන්නේ නම් ඔවුන් සේවයට නුසුදුසු වේ.

(ඉ) *අනෙකුත් සුදුසුකම්* :

අයදුම්කරු අවිවාහක විය යුතු ය. (දික්කසාද වූවන් ද මේ සඳහා නුසුදුස්සන් ලෙස සැලකේ.) අනෙකුත් සුදුසුකම් සම්පූර්ණ කර තිබෙන දැනටමත් ශ්‍රී ලංකා පොලිසියේ සේවය කරන පොලිස් කොස්තාපල් රියදුරන්ට මෙම කොන්දේසිය පමණක් අදාළ නොවේ.

05. *බඳවා ගැනීමේ ක්‍රමය* :

❖ අයදුම්පත් අනුව සුදුසුකම් ලබන අයදුම්කරුවන් ශ්‍රී ලංකා පොලීසිය විසින් පවත්වනු ලබන මූලික සුදුසුකම් පරීක්ෂා කිරීමේ පරීක්ෂණයෙන් සමත්විය යුතු ය. මූලික සුදුසුකම් පරීක්ෂා කිරීමේ පරීක්ෂණයෙන් සමත් වන අයදුම්කරුවන් පහත සඳහන් ශාරීරික යෝග්‍යතා පරීක්ෂණය *හෙවත්* ඔරොත්තු දීමේ පරීක්ෂණය, එනම් දරා ගැනීමේ ශක්තිය උරගා බැලීමේ පරීක්ෂණය සමත් විය යුතු ය.

මීටර් 1000 දිවීම - මිනිත්තු 03 තත්පර 44

- යෝග්‍යතා පරීක්ෂණයෙන් සමත්වන අයදුම්කරුවන් පමණක් අවසන් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. අවසන් සම්මුඛ පරීක්ෂණයෙන් ලකුණු 40% ක් හෝ ඊට වඩා ලකුණු ලබා ගන්නා අයදුම්කරුවන් පමණක් ලිඛිත පරීක්ෂණයට කැඳවනු ලැබේ.

ලිඛිත පරීක්ෂණය ප්‍රශ්නපත්‍ර දෙකකින් සමන්විත වේ. එනම්,

- වාක්‍ය රචනය ප්‍රශ්න පත්‍රය.—කාලය විනාඩි 45 යි. වචන 500 කට නොඅඩු විය යුතු ය.
- සාමාන්‍ය දැනීම හා බුද්ධි පරීක්ෂණය ප්‍රශ්න පත්‍රය.—කාලය පැය 01 යි.

06. *වෛද්‍ය පරීක්ෂණය* :
අයදුම්කරුවන් ස්වකීය පත්වීමට පෙර වෛද්‍ය පරීක්ෂණයකින් සමත් විය යුතු ය. වෛද්‍ය පරීක්ෂණයට බඳවා ගැනීම් ක්‍රියාවලියේ එක් අංගයක් පමණි. වෛද්‍ය පරීක්ෂණයෙන් සමත් වූ අයදුම්කරුවන් අතරින් පවතින පුරප්පාඩු ප්‍රමාණය සඳහා, ප්‍රමුඛතා හා කුසලතා ලැයිස්තුව අනුව තෝරා ගනු ලැබේ. වෛද්‍ය පරීක්ෂණයෙන් අසමත් වූවන් ප්‍රතික්ෂේප කරනු ලැබේ. වෛද්‍ය පරීක්ෂණය පොලිස් රෝහලේ ප්‍රධාන වෛද්‍ය නිලධාරියා විසින් වෛද්‍ය පරීක්ෂණයේ වාර්තා සෞඛ්‍ය 169 පෝරමය යටතේ ඉදිරිපත් කරන අතර වෛද්‍ය පරීක්ෂණය සඳහා පෙනී සිටිය හැක්කේ එක් වරක් පමණි.

07. *පසුබිම් පරීක්ෂණය* :

(අ) අයදුම්කරුගේ යහපත් චරිතය තහවුරු කර ගැනීම සඳහා ඔහු හා ඔහුගේ සමීප ඥාතීන්ගේ ද, ඔහු ඇසුරු කරන්නන්ගේ ද යහපත් චරිතය හා හැසිරීම සම්බන්ධව පරීක්ෂණ පවත්වනු ලබන අතර අයහපත් පසුබිම් වාර්තා සහිත අයදුම්කරුවන් බඳවා ගනු නොලැබේ.

(ආ) බඳවා ගැනීමේ දී අයදුම්කරුවන් විසින් අසත්‍ය තොරතුරු සැපයීම හා තොරතුරු වසන් කිරීම ඔහු බඳවා ගැනීමට නුසුදුසුකමක් වේ. අසත්‍ය තොරතුරු සැපයූ බව හා තොරතුරු වසන් කළ බව බඳවා ගැනීමෙන් පසුව හෙළිවුවහොත් සේවයෙන් ඉවත් කරනු ලැබේ.

08. *රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම* :

- රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය විසින්, 2007.04.28 වැනි දින නිකුත් කර ඇති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 07/2007 අනුව 2007.07.01 වැනි දින සිට රාජ්‍ය සේවයට/පළාත් රාජ්‍ය සේවයට බඳවා ගනු ලබන සියලුම නිලධාරීන්/නිලධාරිනියන් සේවයට බැඳුණු රාජ්‍ය භාෂාවට අතිරේක වශයෙන් අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳව ප්‍රවීණතාවක් සේවයට බැඳී වසර 05 ක් තුළ ලබා ගත යුතු ය.
- 2007.07.01 වැනි දින සිට ශ්‍රී ලංකා පොලිස් සේවයට බඳවා ගනු ලබන සහකාර පොලිස් අධිකාරි තනතුරට පහළ තනතුරු දරන නිලධාරීන් රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව මගින් පවත්වන ද්විතීයික කුසලතා මට්ටමේ භාෂා පාඨමාලා පරීක්ෂණයෙන් සමත් විය යුතු ය.
- පත්වීමේ දින සිට වසර 05 ක් තුළ නියමිත දෙවන භාෂා ප්‍රවීණතාව ලබා නොගන්නා නිලධාරීන්ගේ/නිලධාරිනියන්ගේ වැටුප් වර්ධක, සුදුසුකම් ලබා ගන්නා තෙක් විලම්භනය කරනු ඇත.

09. *පත්වීමේ කොන්දේසි* :

- මෙම පත්වීම ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතු ය.

10. *සේවා කොන්දේසි* :

(අ) පත්වීම තුන් අවුරුදු ආධුනික කාල පරිච්ඡේදයකට යටත් වනු ඇත.

(ආ) බඳවා ගනු ලබන නිළධාරින් රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා ද, දැනටමත් සම්පාදිතව පවත්නා හෝ මින් මතු සම්පාදනය කරනු ලබන කිසියම් නියෝගයක් වෙතොත් ඒවාට ද අනුකූලව කටයුතු කළ යුතු ය.

(ඇ) ඔවුහු ආයතන සංග්‍රහයේ පළමුවැනි සහ දෙවැනි වෙළුමේ අඩංගු නියෝගයන්ට ද මුදල් රෙගුලාසි, පොලිස් නියෝග සහ පොලිස්පතිවරයා විසින් හෝ රජය විසින් හෝ කලින් කලට නිකුත් කරනු ලබන වෙනත් කිසියම් නියෝගයක් වෙතොත් ඒවාට ද යටත් විය යුතු ය.

(ඈ) තනතුර ස්ථිර කිරීමට පෙර සෑම නිලධාරියෙක්ම ශ්‍රී ලංකා පොලීසිය විසින් පවත්වනු ලබන නියමිත පරීක්ෂණවලින් සමත් විය යුතු ය. නියමිත පරීක්ෂණයන්ගෙන් සමත්වීමට අපොහොසත් වන්නවුන් හෝ පොලිස් රාජකාරි කටයුතු සඳහා නුසුදුසු යැයි නිගමනය කරනු ලබන අයවලුන් ද සේවයෙන් ඉවත් කිරීමට ඉඩ ඇත.

(ඉ) පත්කර ගනු ලැබූ නිලධාරීන්ට පොලිස්පතිගේ විශේෂ අවසරය නොමැතිව ඔවුන්ගේ තනතුරෙහි ස්ථිර වනතුරු විවාහ වීමට අවසර දෙනු නොලැබේ. එසේ වුව ද 1973 පෙබරවාරි මස 28 දාතමින් පොලිස් *ගැසට්* II අංක 41 දරන නිවේදනය අනුව හා 2006.10.19 වැනි දින පොලිස්පති චක්‍රලේඛ අංක 1952/2006 අනුව හා 2007.08.09 වැනි දින එම චක්‍රලේඛයේ සංශෝධනය අනුව විශේෂ හේතූන් මත පොලිස්පතිගේ අවසරය ඇතිව විවාහ වීමට හැකියාව ඇත.

(ඊ) අයදුම්කරුවන් පත්කර ගනු ලැබ පුහුණුවෙන් පසු අවුරුදු 03 ක ආධුනික සේවා කාලයක් ශ්‍රී ලංකා පොලීසියේ සේවය කළ යුතු වන අතර මෙම ආධුනික සේවා කාලය අවසන් වීමට පෙර ඔවුන් ඉල්ලා අස්වීමට කැමැත්තේ නම් ඔහුගේ පුහුණුව සඳහා නිල ඇඳුම් ආදිය සම්බන්ධයෙන්

දරන්නට සිදු වූ අනෙකුත් වියදම්, ඉල්ලා අස්වීමේ ලිපිය භාර දෙන අවස්ථාවේදීම නියම කරන ලද මුදලක් ගෙවීමට කැමැත්ත පළ කිරීමේ ගිවිසුමක් ඔවුන් විසින් අත්සන් කළ යුතු ය. මෙම ගෙවීම ශ්‍රී ලංකා පොලිස් විද්‍යාලයේ අධ්‍යක්ෂ විසින් ගණන් බලා තීරණය කරනු ඇත. ඉල්ලා අස්වීම භාර ගැනීම සම්බන්ධයෙන් 1985 හි 1 වැනි වෙළුමෙහි ආයතන සංග්‍රහයේ 5 වැනි පරිච්ඡේදයේ වගන්ති 04 ට අනුකූල විය යුතු ය.

(උ) ආධුනික පොලිස් කොස්තාපල්වරුන්, පුහුණුව ආරම්භ කළ වහාම පොලිස්පති චක්‍රලේඛ අංක 1693/2003 අනුව පොලිස් ආචාර ධර්ම සංග්‍රහයට අනුකූලව ක්‍රියා කරන බවට ප්‍රතිඥා/දිවුරුම් දිය යුතු ය.

(ඌ) ආධුනික පොලිස් කොස්තාපල්වරුන්, පුහුණුව ආරම්භ කළ වහාම පොලිස්පති චක්‍රලේඛ අංක 1804/2004 අනුව අභිමානවත් රාජ්‍ය සේවයකට කැපවීමේ ස්වයං ප්‍රතිඥාව දිය යුතු ය.

(එ) ආධුනික පොලිස් කොස්තාපල්වරුන් සේවය ස්ථිර කිරීමෙන් පසු ශ්‍රී ලංකා පොලිසියේ අනුමත උසස් කිරීමේ පරිපාටිවලට අනුකූලව උසස් කිරීම සඳහා අවකාශ තිබේ.

11. (අ) මෙම *ගැසට් පත්‍රයේ* I කොටස (II අ) වැනි ඡේදයේ ආරම්භයේ පළ කරන ලද රාජ්‍ය සේවා තනතුරුවලට පත්කිරීම් සම්බන්ධයෙන් අදාළවන පොදු කොන්දේසි බලපානු ඇත.

(ආ) 1990.03.10 වැනි දින අංක 15/90 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ පරිදි බඳවා ගැනීම් සිදු කරනු ලැබේ.

12. අයදුම්කරුවන් පහත දැක්වෙන ලිපි ලේඛනවල පිටපත් ස්වකීය අයදුම්පත්‍රවලට අමුණා එවිය යුතු ය. (මුල් ලිපි ලේඛන ඉදිරිපත් නොකළ යුතු ය.) :-

(අ) උප්පැන්න සහතිකය,
(ආ) චරිතය පිළිබඳව මෑතක දී ලබාගත් සහතික දෙකක්, (ඥාතීන් නොවන),
(ඇ) අධ්‍යාපන සුදුසුකම් සනාථ කිරීම සඳහා වූ සහතික,
(ඈ) විශේෂ වාර්තා සහිත ක්‍රීඩා පිළිබඳ සහතික හෝ විෂය බාහිර කටයුතු සම්බන්ධයෙන් ලබාගත් සහතික,
(ඉ) සේවා පළපුරුද්ද සම්බන්ධ සහතික, (තිබේ නම් පමණක්),
(ඊ) ජාතික හැඳුනුම්පතෙහි ඡායා පිටපතක්.

13. (අ) දැනටමත් රාජ්‍ය සේවයෙහි නියුතුව සිටින අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත අදාළ ආයතන ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතු ය. අයදුම්කරු තෝරා ගන්නා ලද්දේ නම් ඔහු නිදහස් කළ හැකි බවට සහතිකයක් අමුණා එවිය යුතු ය.

(ආ) අයදුම්කරු විසින් අයදුම්පත අඟල් 11 x 8 ප්‍රමාණයේ කඩදාසිවල ස්වකීය අත් අකුරුවලින්ම සම්පූර්ණ කර අදාළ සහතික පිටපත් සමග ඉහත දෙවැනි ඡේදයේ දක්වා ඇති ලිපිනයට ලැබෙන සේ එවිය යුතු අතර කුමන හෝ හේතුවක් නිසාවත් එය කිසියම් නිලධාරියකු වෙත පෞද්ගලිකව බාර නොදිය යුතු ය.

14. මෙම නිවේදනයෙහි දක්වා ඇති අවශ්‍යතාවන් සෑම අයුරකින්ම සනාථ නොකරන අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරෙනු ඇත. එබඳු අයදුම්කරුවන්ට ඒ සම්බන්ධයෙන් පිළිතුරු එවනු නොලැබේ.

*සටහන.*— පරීක්ෂණ හා සම්මුඛ පරීක්ෂණවලට කැඳවනු ලබන අයදුම්කරුවන්ට ගමන් වියදම් හෝ අනෙකුත් වියදම් කිසිවක් ශ්‍රී ලංකා පොලීසිය විසින් ගෙවනු නොලැබේ.

පොලිස්පති.

| කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා 2'' x 2 1/2'' ප්‍රමාණය |
|---|

**ශ්‍රී ලංකා පොලිසිය**

*ආධුනික පොලිස් කොස්තාපල් තනතුර (රාජ්‍ය බුද්ධි සේවාව)*

ආදර්ශ අයදුම්පත්‍රය

01. (අ) සම්පූර්ණ නම :———.
(පැහැදිලි ලොකු අකුරෙන්) උප්පැන්න සහතිකයේ සඳහන් කර ඇති පරිදිම විය යුතුය.
(ආ) නම (මුලකුරු සමඟ) :———.
(ඇ) අයදුම් කරන තනතුර :———.

02. ජාතික හැඳුනුම්පත් අංකය :———.
(ජාතික හැඳුනුම්පතේ ඡායා පිටපතක් අමුණා එවිය යුතුය.)

03. පියාගේ සම්පූර්ණ නම :———.

04. අයදුම්කරු උපන් ස්ථානය :———.

උපන් ස්ථානයට අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය :———.
පළාත :———.

05. (අ) වර්තමාන ලිපිනය :———.
(ආ) වර්තමාන ලිපිනයට අදාළ පොලිස් ස්ථානය :———.
(ඇ) ස්ථිර ලිපිනය :———.
(ඈ) ස්ථිර ලිපිනයට අදාළ පොලිස් ස්ථානය :———.
(ඉ) ස්ථිර ලිපිනයට අදාළ ග්‍රාම නිලධාරි වසම :———.
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය :———.
(ඊ) ලිපි හුවමාරු කළයුතු ලිපිනය :———.
(උ) දුරකථන අංකය : නිවස :———. ජංගම :———.

06. (අ) ජන වර්ගය :———.

(ආ) ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙකු වූයේ පරම්පරාවෙන් ද ? නැතහොත් ලියාපදිංචි කිරීමෙන් ද ? (ලියාපදිංචි වීමෙන් නම් එම සහතිකයේ පිටපතක් අමුණන්න) :———.

(ඇ) ඔබ පුරවැසියෙකු වූයේ පරම්පරාවෙන් නම් උපන් ස්ථානය :———.
* අයදුම්කරු :———.
* අයදුම්කරුගේ පියා :———.
* අයදුම්කරුගේ පිය පාර්ශවයේ මුත්තා :———.
* අයදුම්කරුගේ පිය පාර්ශවයේ මී මුත්තා :———.

07. උපන් දිනය :———. (උප්පැන්න සහතිකයේ ඡායා පිටපතක් ඇමිණිය යුතුයි)

වයස : (*ගැසට්* නිවේදනය අනුව අයදුම්පත් භාරගන්නා අවසන් දිනට)
අවුරුදු :———. මාස :———. දින :———.

08. උස : අඩි :———. අඟල් :———.
පපුව : අඟල් :———.

09. අධ්‍යාපන සුදුසුකම් : (සමත් වී ඇති විභාගයන් සඳහන් කර සහතිකවල පිටපත් අමුණා එවිය යුතුය) :———.

10. අතිරේක සුදුසුකම් :———. (සහතිකපත්වල ඡායා පිටපත් ඇමිණිය යුතුය)

11. විවාහක/අවිවාහක බව :———.

12. (අ) දැනට කරන රැකියාව :———.
(ආ) ඔබ සන්නද්ධ සේවාවක සාමාජිකයෙක් ද ? :———.

13. ඔබට විශේෂ දක්ෂතාවයන් හෝ සුදුසුකම් තිබේ ද ? :———.

14. අයදුම්කරු ගැන විමසුම් කළ හැකි ඥාතීන් නොවන දෙදෙනෙකුගේ නම් සහ ලිපිනයන් :

(අ) ———.
(ආ) ———.

15. ඔබ මීට පෙර ශ්‍රී ලංකා පොලිස් සේවයේ සේවය කර තිබේ ද ? :———.

තනතුර සහ නිල අංකය :———.

එසේ නම් ඔබ තනතුරින් ඉවත් වූ හේතු සඳහන් කරන්න. :———.

16. (අ) ඔබ සන්නද්ධ සේවයක සේවය කරන්නේ ද? එසේ නම් අයදුම්පත අදාළ හමුදා ප්‍රධානියාගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. :———.

(ආ) ඔබ සන්නද්ධ සේවාවක සේවය කර ඇත් ද ? එසේ නම් අස්වීමේ දී දෙන සහතිකයේ ඡායා පිටපතක් අමුණන්න :———.

17. (අ) ඔබ සන්නද්ධ ස්වේච්ඡා සේවයට අනුයුක්තව සිටින්නේ ද ? එසේ නම් අයදුම්පත හමුදා ප්‍රධානියාගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. :———.

(ආ) ඔබ සන්නද්ධ ස්වේච්ඡා සේවයෙහි අනුයුක්තව සිටියේ ද ? එසේ නම් අස්වීමේ දී දෙන සහතිකයේ ඡායා පිටපතක් අමුණන්න. :———.

18. ඔබ කිසියම් වරදක් සම්බන්ධයෙන් හෝ සැකපිට අත් අඩංගුවට ගෙන තිබේ ද ? එසේම යම් වරදක් සම්බන්ධයෙන් චෝදනා ලැබ හෝ උසාවියට කැඳවනු ලැබ හෝ දඬුවම් ලැබ හෝ ඇත් ද ? (එසේ නම් විස්තර සඳහන් කරන්න) :———.

19. ඔබගේ කිසියම් ඥාතියෙකු යම් වරදක් සම්බන්ධයෙන් හෝ සැකපිට අත් අඩංගුවට ගෙන තිබේ ද ? එසේ නම් කිසියම් වරදක් සම්බන්ධයෙන් චෝදනා ලැබ හෝ උසාවියකට කැඳවනු ලැබ හෝ දඬුවම් ලැබ ඇත්ද ? එසේ නම් විස්තර සඳහන් කරන්න :———.

ඉහත කරුණු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි ඒවා බවට මින් සහතික කරමි. එසේම ඉහත දැක්වූ තොරතුරු වැරදි හා අසත්‍ය ඒවා බවට හෙළිවුවහොත් මා සේවයට පත්කර ගෙන ඇතත් ඕනෑම අවස්ථාවක දී ශ්‍රී ලංකා පොලීසියේ සේවය වහාම නතර කිරීමට යටත් වන බව දනිමි.

———.
අයදුම්කරුගේ අත්සන.

දිනය :———.

20. ආයතන ප්‍රධානියාගේ සහතිකය : (අදාළ නම් පමණි)

මෙම අයදුම්පත ඉදිරිපත් කරන .......................... මයා ..................... දෙපාර්තමේන්තුවේ/ සංස්ථාවේ/ මණ්ඩලයේ සේවයේ නියුතු අයෙකු බවත් ඔහු මෙම තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් සේවයෙන් මුදා හැරිය හැකි බවත් ප්‍රකාශ කරමි.

———,
ආයතන ප්‍රධානියාගේ අත්සන
සහ නිල මුද්‍රාව

තනතුර :———.
දිනය :———.

06-957/2

---

**ශ්‍රී ලංකා පොලිසිය**

කාන්තා උප පොලිස් පරීක්ෂක තනතුර (රාජ්‍ය බුද්ධි සේවාව)

ශ්‍රී ලංකා පොලිසියේ රාජ්‍ය බුද්ධි සේවාවට සෘජුවම බඳවා ගැනීම සඳහා ආධුනික කාන්තා උප පොලිස් පරීක්ෂක තනතුරට ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. පහත දක්වනු ලබන ආකෘති පත්‍රය අනුව සකස් කරන ලද අයදුම්පත් අධ්‍යක්ෂ/බඳවා ගැනීම්, ආධුනිකයින් බඳවා ගැනීමේ කොට්ඨාසය, අංක 375, පළමු මහල, ශ්‍රී සම්බුද්ධත්ව ජයන්ති මාවත, කොළඹ 06, යන ලිපිනයට එවිය යුතු ය. අයදුම්පත් බහා එවනු ලබන කවරයේ වම් කෙළවරේ ඉහලින් තමා අයදුම්කරන තනතුර සඳහන් කර එය ලියාපදිංචි තැපෑලෙන් 2019.08.30 වැනි දිනට හෝ ඊට පෙර ඉහත සඳහන් ලිපිනයට අයදුම්පත් ලැබීමට සැලැස්විය යුතු ය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් සම්බන්ධයෙන් ක්‍රියා නොකරනු ලබන අතර ශ්‍රී ලංකා පොලිසිය විසින් අයදුම්පත් නිකුත් කරනු නොලැබේ.

03. *වැටුප් ක්‍රමය* :

රු. 3,93,480 - 7 x 4,440 - 2 x 5,940 - 25 x 7,920 - රු. 6,34,440.00

2016.01.01 වැනි දින සිට ගෙවීම් කරනු ලබන්නේ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 3/2016 හි 11 වන උපලේඛනය අනුව වේ. මෙම වැටුප් පරිමාණයන් පූර්ණ වශයෙන් ක්‍රියාත්මක වන්නේ 2020.01.01 වැනි දින සිටය.

තවද මෙම නිලධාරිනියන් 2013.01.07 වැනි දිනැති පොලිස්පති චක්‍රලේඛ අංක 2416/2013 යටතේ ලබා දී ඇති දීමනාවලට ද හිමිකම් ලබයි. ඉහත සඳහන් වැටුප් පරිමාණයට අමතරව මෙහි පහත සඳහන් දීමනා ඔවුන් වෙත මාසිකව හිමිවනු ඇත.

| | | |
|---|---|---|
| (අ) | ජීවන වියදම් දීමනාව | රු. 7,800 0 |
| (ආ) | රා.ප.ච.03/2016 අනුව තනතුරට අදළ 40% දීමනාව | රු. 11,760 0 |
| (ඇ) | වැටුපෙන් 25% ක දීමනාව | රු. 7,350 0 |
| (ඈ) | දුෂ්කර දීමනාව | රු. 2000 0 |
| (ඉ) | දිරි දීමනාව | රු. 800 0 |
| (ඊ) | නිල ඇඳුම් පිරිසිදු කිරීමේ දීමනාව | රු. 250 0 |
| (උ) | සිවිල් ඇඳුම් දීමනාව | රු. 200 0 |
| (ඉ) | සංයුක්ත දීමනා (උපරිම/විශේෂ දීමනා ගෙවනු ලබන ප්‍රදේශ සඳහා) | රු. 12,000 0 |
| (උ) | සංයුක්ත දීමනා (උපරිම/ විශේෂ දීමනා ගෙවනු නොලබන ප්‍රදේශ සඳහා) | රු. 11,200 0 |

*මෙම දීමනා වලට අමතරව* -

(අ) නොමිලේ ගමන් පහසුකම්,
(ආ) නිලධාරිනියන්ට නොමිලේ වෛද්‍ය පහසුකම් (විදේශ රටක දී වුවද ප්‍රතිකාර කිරීමට මුදලින් ආධාර ලබා ගත හැකිය.)
(ඇ) සියලුම නිල ඇඳුම් නොමිලේ සපයනු ලැබේ.
(ඈ) තමාගේ ක්‍රීඩා කෞශල්‍ය හා සහජ හැකියාවන් දියුණු කර ගැනීමේ පහසුකම්.
(ඉ) රාජකාරි සඳහා ගමන් වියදම් දුෂ්කර සේවය හා විශිෂ්ට රාජකාරි සඳහා තෑගි වශයෙන් මුදල් ප්‍රදානය කරනු ලැබේ.
(ඊ) තෝරාගන්නා අයදුම්කරුවන් සාමාන්‍ය ඇඳුමින් සැරසී රාජකාරී කලයුතු අතර, මෙරට හා පිටරට පුහුණුව ලැබීමට සුදනම් විය යුතුය.

04. *අවශ්‍ය මූලික සුදුසුකම්* :

(අ) *වයස් සීමාව* :
*ගැසට්* නිවේදනය අනුව අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 18-28 ත් අතර විය යුතු ය. එසේ වුවද දැනට ශ්‍රී ලංකා පොලිසියේ රාජකාරියේ නියුතු පොලිස් නිලධාරිනියන්ට අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 30 දක්වා අයදුම්කළ හැක.

(ආ) *අධ්‍යාපන සුදුසුකම්* :

- අ.පො.ස (සා. පෙළ) විභාගයෙන් එකවර විෂයයන් 06කින් සමත්ව එම විෂයයන් 04ක් සඳහා සම්මාන සාමාර්ථ තිබිය යුතු අතර, ඉන් 02ක් මාධ්‍ය භාෂාව හා ගණිතය විය යුතු ය.
- අයදුම්කාරිය අ.පො.ස. (උ.පෙළ) විභාගයෙන් එකවර විෂයයන් 03ක් සමත්විය යුතුය.

**සටහන 01** : ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ විෂය වර්ගීකරණය අනුව විෂයය අංක 41, 44 දරන විද්‍යා විෂයය යුගලය එක් විෂයයක් ලෙස ද, අංක 42 සහ 45 දරන ගණිතය විෂය යුගලය එක් විෂයයක් වශයෙන් ද, සලකා විභාගයෙන් සමත් විෂයය සංඛ්‍යාව තීරණය කරනු ලැබේ.

**සටහන 02** : අ.පො.ස (සා. පෙළ) විභාගයේ තාක්ෂණ විෂය ලිඛිත පරීක්ෂණයෙන් අසමත්වීම එම විෂයයේ ප්‍රායෝගික පරීක්ෂණය සමත් වුව ද එම විෂයය අසමත් ලෙස සලකනු ලැබේ.

**සටහන 03** : වෛකල්පිත දෙමළ, ඉංග්‍රීසි සහ සිංහල විෂයය අ.පො.ස. (සා. පෙළ) විෂයය ධාරාවට ඇතුළත් නොවන හෙයින් එම විෂයයන් සමත්වීම අ.පො.ස (සා. පෙළ) විභාගයෙන් සමත් විෂයයක් ලෙස ගණනය කරනු නොලැබේ.

(ඈ) *ශාරීරික සුදුසුකම්* :

- උස අඩි 05 යි. අඟල් 04 යි. (අවම),

*සටහන* : විශිෂ්ට ක්‍රීඩා කෞශල්‍යයකින් යුක්තවූත් ජාතික ක්‍රීඩා සංචිතයක සිට ජාතික මට්ටමේ ක්‍රීඩාවල දී විශිෂ්ටත්වයක් දක්වා ඇති හෝ ජාත්‍යන්තර තරගයකට සහභාගි වී ශ්‍රී ලංකාවට කීර්තියක් අත්කර දුන් අයදුම්කාරියකගේ ශාරීරික සුදුසුකම් මඳක් අඩු වුව ද අනෙක් සුදුසුකම් සපුරා ඇතිනම් පොලිස්පතිගේ අභිමතය පරිදි බඳවා ගැනීම සඳහා සුදුසුකම් ලබයි.

(ඉ) *දෘෂ්ඨිය පිළිබඳ අවශ්‍යතාවයන්.*— එක් ඇසක දෘෂ්ඨිය 6/12 අඩු නොවිය යුතු ය. දෘෂ්ඨිය එක් ඇසක 6/6 සහ අනෙක් ඇසෙහි 6/18 වේනම් එය ද පිළිගනු ලැබේ. වර්ණ දෘෂ්ඨිය සාමාන්‍ය විය යුතු ය. යම් අයදුම්කාරියක් උපැස් යුවලක් හෝ ස්පර්ශකාච පාවිච්චි කරන්නේ නම් ඔවුන් සේවයට නුසුදුසු වේ.

(ඊ) *අනෙක් සුදුසුකම්* :

* අයදුම්කාරිය අවිවාහක විය යුතු ය. (දික්කසාද වූවන් ද මේ සඳහා නුසුදුස්සන් ලෙස සැලකේ.) අනෙකුත් සුදුසුකම් සම්පූර්ණ කර තිබෙන දැනටමත් ශ්‍රී ලංකා පොලිසියේ සේවය කරන පොලිස් නිලධාරිනියන්ට මෙම කොන්දේසිය පමණක් අදාළ නොවේ.

05. *බඳවා ගැනීමේ ක්‍රමය* :

❖ අයදුම්පත්‍රය අනුව සුදුසුකම් ලබන අයදුම්කාරියන් ශ්‍රී ලංකා පොලිසිය විසින් පවත්වනු ලබන මූලික සුදුසුකම් පරීක්ෂා කිරීමේ පරීක්ෂණයෙන් සමත්විය යුතු ය. මූලික සුදුසුකම් පරීක්ෂා කිරීමේ පරීක්ෂණයෙන් සමත් වන අයදුම්කාරියන් පහත සඳහන් ශාරීරික යෝග්‍යතා පරීක්ෂණය *හෙවත්* ඔරොත්තු දීමේ පරීක්ෂණය, එනම් දරා ගැනීමේ ශක්තිය උරගා බැලීමේ පරීක්ෂණය සමත් විය යුතු ය.

මීටර් 1000 දිවීම - මිනිත්තු 05 තත්පර 14

❖ යෝග්‍යතා පරීක්ෂණයෙන් සමත් වන අයදුම්කාරියන් පමණක් අවසන් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. අවසන් සම්මුඛ පරීක්ෂණයෙන් ලකුණු 40% ක් හෝ ඊට වඩා ලකුණු ලබා ගන්නා අයදුම්කාරියන් පමණක් ලිඛිත පරීක්ෂණයට කැඳවනු ලැබේ.

❖ ලිඛිත පරීක්ෂණය ප්‍රශ්නපත්‍ර දෙකකින් සමන්විත වේ. එනම්,

- වාක්‍ය රචනය ප්‍රශ්න පත්‍රය. කාලය විනාඩි 45 යි. වචන 500 කට නොඅඩු විය යුතු ය.
- සාමාන්‍ය දැනීම හා බුද්ධි පරීක්ෂණය ප්‍රශ්න පත්‍රය. කාලය පැය 01 යි.

06. *වෛද්‍ය පරීක්ෂණය* :

අයදුම්කාරියන් ස්වකීය පත්වීමට පෙර වෛද්‍ය පරීක්‍ෂණයකින් සමත් විය යුතු ය. වෛද්‍ය පරීක්‍ෂණය බඳවා ගැනීම් ක්‍රියාවලියේ එක් අංගයක් පමණි. වෛද්‍ය පරීක්‍ෂණයෙන් සමත් වූ අයදුම්කාරියන් අතරින් පවතින පුරප්පාඩු ප්‍රමාණය සඳහා ප්‍රමුඛතා හා කුසලතා ලැයිස්තුව අනුව තෝරා ගනු ලැබේ. වෛද්‍ය පරීක්‍ෂණයෙන් අසමත් වූවන් ප්‍රතික්ෂේප කරනු ලැබේ. වෛද්‍ය පරීක්‍ෂණය පොලිස් රෝහලේ ප්‍රධාන වෛද්‍ය නිලධාරියා විසින් වෛද්‍ය පරීක්‍ෂණයේ වාර්තා සෞඛ්‍ය 169 පෝරමය යටතේ ඉදිරිපත් කරන අතර වෛද්‍ය පරීක්‍ෂණය සඳහා පෙනී සිටිය හැක්කේ එක් වරක් පමණි.

07. *පසුබිම් පරීක්ෂණය* :

(අ) අයදුම්කාරියන්ගේ යහපත් චරිතය තහවුරු කර ගැනීම සඳහා ඇය හා ඇයගේ සමීප ඥාතීන්ගේ ද, ඇය ඇසුරු කරන්නන්ගේ ද යහපත් චරිතය හා හැසිරීම සම්බන්ධව පරීක්ෂණ පවත්වනු ලබන අතර අයහපත් පසුබිම් වාර්තා සහිත අයදුම්කාරියන් බඳවා ගනු නොලැබේ.

(ආ) බඳවා ගැනීමේ දී අයදුම්කාරියන් විසින් අසත්‍ය තොරතුරු සැපයීම හා තොරතුරු වසන් කිරීම ඇය බඳවා ගැනීමට නුසුදුසුකමක් වේ. අසත්‍ය තොරතුරු සැපයූ බව හා තොරතුරු වසන් කළ බව බඳවා ගැනීමෙන් පසුව හෙළිවුවහොත් සේවයෙන් ඉවත් කරනු ලැබේ.

08. *රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම* :

- රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය විසින්, 2007.04.28 වැනි දින නිකුත් කර ඇති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 07/2007 අනුව 2007.07.01 වැනි දින සිට රාජ්‍ය සේවයට/පළාත් රාජ්‍ය සේවයට බඳවා ගනු ලබන සියලුම නිලධාරීන්/නිලධාරිනියන් සේවයට බැඳුණු රාජ්‍ය භාෂාවට අතිරේක වශයෙන් අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳව ප්‍රවීණතාවක් සේවයට බැඳී වසර 05 ක් තුළ ලබා ගත යුතු ය.
- 2007.07.01 වැනි දින සිට ශ්‍රී ලංකා පොලිස් සේවයට බඳවා ගනු ලබන සහකාර පොලිස් අධිකාරි තනතුරට පහළ තනතුරු දරන නිලධරයන් රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව මගින් පවත්වන ද්විතීයික කුසලතා මට්ටමේ භාෂා පාඨමාලා පරීක්ෂණයෙන් සමත් විය යුතු ය.
- පත්වීමේ දින සිට වසර 05 ක් තුළ නියමිත දෙවන භාෂා ප්‍රවීණතාව ලබා නොගන්නා නිලධාරීන්/නිලධාරිනියන්ගේ වැටුප් වර්ධක, සුදුසුකම් ලබා ගන්නා තෙක් විලම්භනය කරනු ඇත.

09. *පත්වීමේ කොන්දේසි* :

- මෙම පත්වීම ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතු ය.

10. *සේවා කොන්දේසි* :

(අ) පත්වීම තුන් අවුරුදු පරිවාස කාල පරිච්ඡේදයකට යටත් වනු ඇත.

(ආ) බඳවා ගනු ලබන නිළධාරිනියන් රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා ද, දැනටමත් සම්පාදිතව පවත්නා හෝ මින් මතු සම්පාදනය කරනු ලබන කිසියම් නියෝගයක් වෙතොත් ඒවාට ද අනුකූලව කටයුතු කළ යුතු ය.

(ඇ) ඔවුහු ආයතන සංග්‍රහයේ පළමුවැනි සහ දෙවැනි වෙළුමේ අඩංගු නියෝගයන්ට ද මුදල් රෙගුලාසි, පොලිස් නියෝග සහ පොලිස්පතිවරයා විසින් හෝ රජය විසින් හෝ කලින් කලට නිකුත් කරනු ලබන වෙනත් කිසියම් නියෝගයක් වෙතොත් ඒවාට ද යටත් විය යුතු ය.

(ඈ) තනතුර ස්ථිර කිරීමට පෙර සෑම නිලධාරිනියක්ම ශ්‍රී ලංකා පොලිසිය විසින් පවත්වනු ලබන නියමිත පරීක්ෂණවලින් සමත් විය යුතු ය. නියමිත පරීක්ෂණයන්ගෙන් සමත්වීමට අපොහොසත් වන්නවුන් හෝ පොලිස් රාජකාරි කටයුතු සඳහා නුසුදුසු යැයි නිගමනය කරනු ලබන අයවලුන් ද සේවයෙන් ඉවත් කිරීමට ඉඩ ඇත.

(ඉ) පත්කර ගනු ලැබූ නිලධාරිනීන්ට පොලිස්පතිගේ විශේෂ අවසරය නොමැතිව ඔවුන්ගේ තනතුරෙහි ස්ථිර වනතුරු විවාහ වීමට අවසර දෙනු නොලැබේ. එසේ වුව ද 1973 පෙබරවාරි මස 28 දාතමින් පොලිස් *ගැසට්* II අංක 41 දරන නිවේදනය අනුව හා 2006.10.19 වැනි දින පොලිස්පති චක්‍රලේඛ අංක 1952/2006 අනුව හා 2007.08.09 වැනි දින එම චක්‍රලේඛයේ සංශෝධනය අනුව විශේෂ හේතුන් මත පොලිස්පතිගේ අවසරය ඇතිව විවාහ වීමට හැකියාව ඇත.

(ඊ) අයදුම්කාරියන් පත්කර ගනු ලැබ පුහුණුවෙන් පසු අවුරුදු 03 ක පරිවාස සේවා කාලයක් ශ්‍රී ලංකා පොලිසියේ සේවය කළ යුතු වන අතර මෙම පරිවාස සේවා කාලය අවසන් වීමට පෙර ඔවුන් ඉල්ලා අස්වීමට කැමැත්තේ නම් ඔවුන්ගේ පුහුණුව සඳහා නිල ඇඳුම් ආදිය සම්බන්ධයෙන් දරන්නට සිදු වූ අනෙකුත් වියදම්, ඉල්ලා අස්වීමේ ලිපිය භාර දෙන අවස්ථාවේදීම නියම කරන ලද මුදලක් ගෙවීමට කැමැත්ත පළ කිරීමේ ගිවිසුමක් ඔවුන් විසින් අත්සන් කළ යුතු ය. මෙම ගෙවීම ශ්‍රී ලංකා පොලිස් විද්‍යාලයේ අධ්‍යක්ෂ විසින් ගණන් බලා තීරණය කරනු ඇත. ඉල්ලා අස්වීම භාර ගැනීම සම්බන්ධයෙන් 1985 හි 1 වැනි වෙළුමෙහි ආයතන සංග්‍රහයේ 5 වැනි පරිච්ඡේදයේ වගන්ති 04 ට අනුකූල විය යුතු ය.

(උ) ආධුනික කාන්තා උප පොලිස් පරීක්ෂකවරියන්, පුහුණුව ආරම්භ කළ වහාම පොලිස්පති චක්‍රලේඛ අංක 1693/2003 අනුව පොලිස් ආචාර ධර්ම සංග්‍රහයට අනුකූලව ක්‍රියා කරන බවට ප්‍රතිඥා/දිවුරුම් දිය යුතු ය.

(ඌ) ආධුනික කාන්තා උප පොලිස් පරීක්ෂකවරියන්, පුහුණුව ආරම්භ කළ වහාම පොලිස්පති චක්‍රලේඛ අංක 1804/2004 අනුව අභිමානවත් රාජ්‍ය සේවයකට කැපවීමේ ස්වයං ප්‍රතිඥාව දිය යුතු ය.

(එ) ආධුනික කාන්තා උප පොලිස් පරීක්ෂකවරියන් ශ්‍රී ලංකා පොලිසියේ අනුමත උසස් කිරීමේ පටිපාටිවලට අනුකූලව උසස් කිරීම සඳහා අවකාශ තිබේ.

11. (අ) මෙම *ගැසට් පත්‍රයේ* I කොටස (II අ) වැනි ඡේදයේ ආරම්භයේ පළ කරන ලද රාජ්‍ය සේවා තනතුරුවලට පත්කිරීම් සම්බන්ධයෙන් අදාළවන පොදු කොන්දේසි බලපානු ඇත.

(ආ) 1990.03.10 වැනි දින අංක 15/90 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ පරිදි බඳවා ගැනීම් සිදු කරනු ලැබේ.

12. අයදුම්කාරියන් පහත දැක්වෙන ලිපි ලේඛනවල පිටපත් ස්වකීය අයදුම්පත්‍රවලට අමුණා එවිය යුතු ය. (මුල් ලිපි ඉදිරිපත් නොකළ යුතු ය.) :-

(අ) උප්පැන්න සහතිකය,
(ආ) චරිතය පිළිබඳව මෑතක දී ලබාගත් සහතික දෙකක්, (ඥාතීන් නොවන),
(ඇ) අධ්‍යාපන සුදුසුකම් සනාථ කිරීම සඳහා වූ සහතික,
(ඈ) විශේෂ වාර්තා සහිත ක්‍රීඩා පිළිබඳ සහතික හෝ විෂයය බාහිර කටයුතු සම්බන්ධයෙන් ලබාගත් සහතික,
(ඉ) සේවා පළපුරුද්ද සම්බන්ධ සහතික, (තිබේ නම් පමණක්),
(ඊ) ජාතික හැඳුනුම්පතෙහි ඡායා පිටපතක්.

13. (අ) දැනටමත් රාජ්‍ය සේවයෙහි නියුතුව සිටින අයදුම්කාරියන් ඔවුන්ගේ අයදුම්පත අදාළ ආයතන ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතු ය. අයදුම්කාරිය තෝරා ගන්නා ලද්දේ නම් ඇය නිදහස් කළ හැකි බවට සහතිකයක් අමුණා එවිය යුතු ය.

(ආ) අයදුම්කාරිය විසින් අයදුම්පත අඟල් 11 x 8 ප්‍රමාණයේ කඩදාසිවල ස්වකීය අත් අකුරුවලින්ම සම්පූර්ණ කර අදාළ සහතික පිටපත් සමග ඉහත දෙවැනි ඡේදයේ දක්වා ඇති ලිපිනයට ලැබෙන සේ එවිය යුතු අතර කුමන හෝ හේතුවක් නිසාවත් එය කිසියම් නිලධාරියෙකු වෙත පෞද්ගලිකව බාර නොදිය යුතු ය.

14. මෙම නිවේදනයෙහි දක්වා ඇති අවශ්‍යතාවන් සෑම අයුරකින්ම සනාථ නොකරන අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරෙනු ඇත. එබඳු අයදුම්කාරියන්ට ඒ සම්බන්ධයෙන් පිළිතුරු එවනු නොලැබේ.

*සටහන.*— පරීක්ෂණ හා සම්මුඛ පරීක්ෂණවලට කැඳවනු ලබන අයදුම්කරුකාරියන්ට ගමන් වියදම් හෝ අනෙකුත් වියදම් කිසිවක් ගෙවනු නොලැබේ.

පොලිස්පති.

අඟල් 2

අඟල් 1 1/2 **කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා**

**ශ්‍රී ලංකා පොලිසිය**

***ආධුනික කාන්තා උප පොලිස් පරීක්ෂක තනතුර (රාජ්‍ය බුද්ධි සේවාව)***

*ආදර්ශ අයදුම්පත්‍රය*

01. (අ) සම්පූර්ණ නම :———.
(පැහැදිලි ලොකු අකුරෙන්) උප්පැන්න සහතිකයේ සඳහන් කර ඇති පරිදිම විය යුතුය.
(ආ) නම (මුලකුරු සමඟ) :———.
(ඇ) අයදුම් කරන තනතුර :———.

02. ජාතික හැඳුනුම්පත් අංකය :———.
(ජාතික හැඳුනුම්පතේ ඡායා පිටපතක් අමුණා එවිය යුතුය.)

03. පියාගේ සම්පූර්ණ නම :———.

04. අයදුම්කාරිය උපන් ස්ථානය :———.
උපන් ස්ථානයට අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය :———.
පළාත :———.

05. (අ) වර්තමාන ලිපිනය :———.
(ආ) වර්තමාන ලිපිනයට අදාළ පොලිස් ස්ථානය :———.
(ඇ) ස්ථිර ලිපිනය :———.
(ඈ) ස්ථිර ලිපිනයට අදාළ පොලිස් ස්ථානය :———.
(ඉ) ස්ථිර ලිපිනයට අදාළ ග්‍රාම නිලධාරි වසම :———.
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය :———.
(ඊ) ලිපි හුවමාරු කළයුතු ලිපිනය :———.
(උ) දුරකථන අංකය : නිවස :———. ජංගම :———.

06. (අ) ජාතිය :———.
(ආ) ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙකු වූයේ පරම්පරාවෙන් ද ? නැතහොත් ලියාපදිංචි කිරීමෙන් ද ? (ලියාපදිංචි වීමෙන් නම් එම සහතිකයේ පිටපතක් අමුණන්න) :———.
(ඇ) ඔබ පුරවැසියෙකු වූයේ පරම්පරාවෙන් නම් උපන් ස්ථානය :———.
* අයදුම්කරු :———.
* අයදුම්කරුගේ පියා :———.
* අයදුම්කරුගේ පිය පක්ෂයේ මුත්තා :———.
* අයදුම්කරුගේ පිය පක්ෂයේ මී මුත්තා :———.

07. උපන් දිනය :———. (උප්පැන්න සහතිකයේ ඡායා පිටපතක් ඇමිණිය යුතුයි)
වයස : (*ගැසට්* නිවේදනය අනුව අයදුම්පත් භාරගන්නා අවසන් දිනට)
අවුරුදු :———. මාස :———. දින :———.

08. උස : අඩි :———. අඟල් :———.

09. අධ්‍යාපන සුදුසුකම් : (සමත් වී ඇති විභාගයන් සඳහන් කර සහතිකවල පිටපත් අමුණා එවිය යුතුය) :———.

10. අතිරේක සුදුසුකම් :———. (සහතිකපත්වල ඡායා පිටපත් ඇමිණිය යුතුය)

11. විවාහක/අවිවාහක බව :———.

12. (අ) දැනට කරන රැකියාව :———.
(ආ) ඔබ සන්නද්ධ සේවාවක සාමාජිකාවන් ද ? :———.

13. ඔබට විශේෂ දක්ෂතාවයන් හෝ සුදුසුකම් තිබේ ද ? :———.

14. අයදුම්කාරිය ගැන විමසුම් කළ හැකි ඥාතීන් නොවන දෙදෙනෙකුගේ නම් සහ ලිපිනයන් :
(අ) ———.
(ආ) ———.

15. ඔබ මීට පෙර ශ්‍රී ලංකා පොලීසියේ සේවය කර තිබේ ද ? :———.
තනතුර සහ නිල අංකය :———.
එසේ නම් ඔබ තනතුරින් ඉවත් වූ හේතු සඳහන් කරන්න. :———.

16. (අ) ඔබ සන්නද්ධ සේවයක සේවය කරන්නේ ද? එසේ නම් අයදුම්පත අදාළ හමුදා ප්‍රධානියාගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. :———.
(ආ) ඔබ සන්නද්ධ සේවාවක සේවය කර ඇත් ද ? එසේ නම් අස්වීමේ දී දෙන සහතිකයේ ඡායා පිටපතක් අමුණන්න :———.

17. (අ) ඔබ සන්නද්ධ ස්වේච්ඡා සේවයට අනුයුක්තව සිටින්නේ ද ? එසේ නම් අයදුම්පත හමුදා ප්‍රධානියාගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. :———.
(ආ) ඔබ සන්නද්ධ ස්වේච්ඡා සේවයෙහි අනුයුක්තව සිටියේ ද ? එසේ නම් අස්වීමේ දී දෙන ලද සහතිකයේ ඡායා පිටපතක් අමුණන්න. :———.

18. ඔබ කිසියම් වරදක් සම්බන්ධයෙන් හෝ සැකපිට අත් අඩංගුවට ගෙන තිබේ ද ? එසේම යම් වරදක් සම්බන්ධයෙන් චෝදනා ලැබ හෝ උසාවියට කැඳවනු ලැබ හෝ දඬුවම් ලැබ හෝ ඇත් ද ? (එසේ නම් විස්තර සඳහන් කරන්න) :———.

19. ඔබගේ කිසියම් ඥාතියෙකු යම් වරදක් සම්බන්ධයෙන් හෝ සැකපිට අත් අඩංගුවට ගෙන තිබේ ද ? එසේම යම් වරදක් සම්බන්ධයෙන් චෝදනා ලැබ හෝ උසාවියකට කැඳවනු ලැබ හෝ දඬුවම් ලැබ ඇද්ද ? එසේ නම් විස්තර සඳහන් කරන්න :———.

ඉහත කරුණු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි ඒවා බවට මින් සහතික කරමි. එසේම ඉහත දැක්වූ තොරතුරු වැරදි හා අසත්‍ය ඒවා බවට හෙළිවුවහොත් මා සේවයට පත්කර ගෙන ඇතත් ඕනෑම අවස්ථාවක දී ශ්‍රී ලංකා පොලීසියේ සේවය වහාම නතර කිරීමට යටත් වන බව දනිමි.

———,
අයදුම්කාරියගේ අත්සන.

දිනය :———.

20. දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය : (අදාළ නම් පමණි)

මෙම අයදුම්පත ඉදිරිපත් කරන ......................... මයා/ මිය/මෙනවිය .................... දෙපාර්තමේන්තුවේ/ සංස්ථාවේ/ මණ්ඩලයේ සේවයේ නියුතු අයෙකු බවත්, ඔහු/ඇය මෙම තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් සේවයෙන් මුදා හැරිය හැකි බවත් ප්‍රකාශ කරමි.

———,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන
තනතුර (රබර් මුද්‍රාව සහිත)

තනතුර :———.
දිනය :———.

06-957/3

**ශ්‍රී ලංකා පොලීසිය**

කාන්තා පොලිස් කොස්තාපල් තනතුර (රාජ්‍ය බුද්ධි සේවාව)

ශ්‍රී ලංකා පොලිසියේ රාජ්‍ය බුද්ධි සේවාවට සෘජුවම බඳවා ගැනීම සඳහා ආධුනික කාන්තා පොලිස් කොස්තාපල් තනතුරට ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. පහත දක්වනු ලබන ආකෘති පත්‍රය අනුව සකස් කරන ලද අයදුම්පත් අධ්‍යක්ෂ, බඳවා ගැනීම්, ආධුනිකයින් බඳවා ගන්නා කොට්ඨාසය, අංක 375, පළමු මහල, ශ්‍රී සම්බුද්ධත්ව ජයන්ති මාවත, කොළඹ 06, යන ලිපිනයට එවිය යුතු ය. අයදුම්පත් බහා එවනු ලබන කවරයේ වම් කෙළවරේ ඉහලින් තමා අයදුම්කරන තනතුර සඳහන් කර එය ලියාපදිංචි තැපෑලෙන් 2019.08.30 වැනි දිනට හෝ ඊට පෙර ඉහත සඳහන් ලිපිනයට ලැබීමට සැලැස්විය යුතු ය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් සම්බන්ධයෙන් ක්‍රියා නොකරනු ලබන අතර ශ්‍රී ලංකා පොලිසිය විසින් අයදුම්පත් නිකුත් කරනු නොලැබේ.

03. *වැටුප් ක්‍රමය* :

රු. 3,54,480 - 7 x 3,600 - 27 x 4,440 - රු. 4,99,560.00

2016.01.01 වැනි දින සිට ගෙවීම් කරනු ලබන්නේ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 3-2016 හි 11 වන උපලේඛනය අනුව වේ. මෙම වැටුප් පරිමාණයන් පූර්ණ වශයෙන් ක්‍රියාත්මක වන්නේ 2020.01.01 වැනි දින සිටය.

තවද මෙම නිලධාරිනියන් 2013.01.07 වැනි දිනැති පොලිස්පති චක්‍රලේඛ අංක 2416/2013 යටතේ ලබා දී ඇති දීමනාවලට ද හිමිකම් ලබයි. ඉහත සඳහන් වැටුප් පරිමාණයට අමතරව මෙහි පහත සඳහන් දීමනා ඔවුන් වෙත මාසිකව හිමිවනු ඇත.

| | | |
|---|---|---|
| (අ) | ජීවන වියදම් දීමනාව | රු. 7,800 0 |
| (ආ) | රා.ප.ච.03/2016 අනුව තනතුරට අදාළ 40% දීමනාව | රු. 10,595 0 |
| (ඇ) | වැටුපෙන් 25% ක දීමනාව | රු. 6,622 0 |
| (ඈ) | දුෂ්කර දීමනාව | රු. 2000 0 |
| (ඉ) | දිරි දීමනාව | රු. 800 0 |
| (ඊ) | නිල ඇඳුම් පිරිසිදු කිරීමේ දීමනාව | රු. 250 0 |
| (උ) | සිවිල් ඇඳුම් දීමනාව | රු. 200 0 |
| (ඌ) | සංයුක්ත දීමනා (උපරිම/ විශේෂ දීමනා ගෙවනු ලබන ප්‍රදේශ සඳහා) | රු. 10,500 0 |
| (එ) | සංයුක්ත දීමනා (උපරිම/ විශේෂ දීමනා ගෙවනු නොලබන ප්‍රදේශ සඳහා) | රු. 9,800 0 |

*මෙම දීමනා වලට අමතරව -*

(අ) නොමිලේ ගමන් පහසුකම්,
(ආ) නිලධාරිනියන්ට නොමිලේ වෛද්‍ය පහසුකම් (විදේශ රටක දී වුවද ප්‍රතිකාර කිරීමට මුදලින් ආධාර ලබා ගත හැකිය.
(ඇ) සියලුම නිල ඇඳුම් නොමිලේ සපයනු ලැබේ.
(ඈ) තමාගේ ක්‍රීඩා කෞශල්‍ය හා සහජ හැකියාවන් දියුණු කර ගැනීමේ පහසුකම්.
(ඉ) රාජකාරි සඳහා ගමන් වියදම් ද, දුෂ්කර සේවය හා විශිෂ්ට රාජකාරි සඳහා තෑගි වශයෙන් මුදල් ද ප්‍රදානය කරනු ලැබේ.
(ඊ) තෝරාගන්නා අයදුම්කරුවන් සාමාන්‍ය ඇඳුමින් සැරසී රාජකාරී කළයුතු අතර, මෙරට හා පිටරට පුහුණුව ලැබීමට සුදානම් විය යුතුය.

04. *අවශ්‍ය මූලික සුදුසුකම්* :

(අ) *වයස් සීමාව* :
*ගැසට්* නිවේදනය අනුව අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 18-28 ත් අතර විය යුතු ය.

(ආ) *අධ්‍යාපන සුදුසුකම්* :
අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් ගණිතය හා මාධ්‍ය භාෂාව ඇතුළුව දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයන් 06ක් සමත් විය යුතුය. වාර දෙකක දී සාමාර්ථය ලබන අපේක්ෂිකාවක් ප්‍රථම වාරයේදී විෂයන් 05ක් සමත් විය යුතුය. (විෂයන් 05 ඇතුළත ගණිතය හෝ මාධ්‍ය භාෂාව යන විෂයන් දෙකම හෝ ඉන් එකක් හෝ සමත්විය යුතුය)

***සටහන 01*** : ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ විෂය වර්ගීකරණය අනුව විෂයය අංක 41, 44 දරන විද්‍යා විෂයය යුගලය එක් විෂයයක් ලෙස ද, අංක 42 සහ 45 දරන ගණිතය විෂය යුගලය එක් විෂයයක් ලෙස ද, සලකා විභාගයෙන් සමත් විෂයය සංඛ්‍යාව තීරණය කරනු ලැබේ.

***සටහන 02*** : අ.පො.ස (සා. පෙළ) විභාගයේ තාක්ෂණ විෂයය ලිඛිත පරීක්ෂණයෙන් අසමත්වීම එම විෂයයේ ප්‍රායෝගික පරීක්ෂණය සමත් වුව ද එම විෂයය අසමත් ලෙස සලකනු ලැබේ.

***සටහන 03*** : වෛකල්පිත දෙමළ, ඉංග්‍රීසි සහ සිංහල විෂයය අ.පො.ස. (සා. පෙළ) විෂයය ධාරාවට ඇතුළත් නොවන හෙයින් එම විෂයයන් සමත්වීම අ.පො.ස (සා. පෙළ) විභාගයෙන් සමත් විෂයයක් ලෙස ගණනය කරනු නොලැබේ.

(ඇ) *ශාරීරික සුදුසුකම්* :

- උස අඩි 05 යි. අඟල් 02 යි. (අවම),

***සටහන*** : විශිෂ්ට ක්‍රීඩා කෞෂල්‍යයකින් යුක්ත වූත් ජාතික ක්‍රීඩා සංචිතයක සිට ජාතික මට්ටමේ ක්‍රීඩාවල දී විශිෂ්ටත්වයක් දක්වා ඇති හෝ ජාත්‍යන්තර තරගයකට සහභාගි වී ශ්‍රී ලංකාවට කීර්තියක් අත්කර දුන් අයදුම්කාරියකගේ ශාරීරික සුදුසුකම් මදක් අඩු වුව ද අනෙක් සුදුසුකම් සපුරා ඇතිනම් පොලිස්පතිගේ අභිමතය පරිදි බඳවා ගැනීම සඳහා මූලික සුදුසුකම් ලබයි.

(ඈ) *දෘෂ්ටිය පිළිබඳ අවශ්‍යතාවයන්*.— එක් ඇසක දෘෂ්ටිය 6/12 අඩු නොවිය යුතු ය. දෘෂ්ටිය එක් ඇසක 6/6 සහ අනෙක් ඇසෙහි 6/18 වේ නම් එය ද පිළිගනු ලැබේ. වර්ණ දෘෂ්ටිය සාමාන්‍ය විය යුතු ය. යම් අයදුම්කාරියක් උපැස් යුවලක් හෝ ස්පර්ශකාච පාවිච්චි කරන්නේ නම් ඔවුන් සේවයට නුසුදුසු වේ.

(ඉ) *අනෙකුත් සුදුසුකම්* :

❖ අයදුම්කාරිය අවිවාහක විය යුතු ය. (දික්කසාද වූවන් ද මේ සඳහා නුසුදුස්සන් ලෙස සැලකේ.)

05. *බඳවා ගැනීමේ ක්‍රමය* :

❖ අයදුම්පත් අනුව සුදුසුකම් ලබන අයදුම්කාරියන් ශ්‍රී ලංකා පොලීසිය විසින් පවත්වනු ලබන මූලික සුදුසුකම් පරීක්ෂා කිරීමේ පරීක්ෂණයෙන් සමත්විය යුතු ය. මූලික සුදුසුකම් පරීක්ෂා කිරීමේ පරීක්ෂණයෙන් සමත් වන අයදුම්කාරියන් පහත සඳහන් ශාරීරික යෝග්‍යතා පරීක්ෂණය *හෙවත්* ඔරොත්තු දීමේ පරීක්ෂණය, එනම් දරා ගැනීමේ ශක්තිය උරගා බැලීමේ පරීක්ෂණයෙන් සමත් විය යුතු ය.

මීටර් 1000 දිවීම - මිනිත්තු 05 තත්පර 14

❖ යෝග්‍යතා පරීක්ෂණයෙන් සමත් වන අයදුම්කාරියන් පමණක් අවසන් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. අවසන් සම්මුඛ පරීක්ෂණයෙන් ලකුණු 40% ක් හෝ ඊට වඩා ලකුණු ලබා ගන්නා අයදුම්කාරියන් පමණක් ලිඛිත පරීක්ෂණයට කැඳවනු ලැබේ.

ලිඛිත පරීක්ෂණය ප්‍රශ්න පත්‍ර දෙකකින් සමන්විත වේ. එනම්,

- වාක්‍ය රචනය ප්‍රශ්න පත්‍රය.-කාලය විනාඩි 45 යි. වචන 500 කට නොඅඩු විය යුතු ය.
- සාමාන්‍ය දැනීම හා බුද්ධි පරීක්ෂණය ප්‍රශ්න පත්‍රය.-කාලය පැය 01 යි.

06. *වෛද්‍ය පරීක්ෂණය* :
අයදුම්කාරියන් ස්වකීය පත්වීමට පෙර වෛද්‍ය පරීක්ෂණයකින් සමත් විය යුතු ය. වෛද්‍ය පරීක්ෂණය බඳවා ගැනීම් ක්‍රියාවලියේ එක් අංගයක් පමණි. වෛද්‍ය පරීක්ෂණයෙන් සමත් වූ අයදුම්කාරියන් අතරින් පවතින පුරප්පාඩු ප්‍රමාණය, සඳහා ප්‍රමුඛතා හා කුසලතා ලැයිස්තුව අනුව තෝරා ගනු ලැබේ. වෛද්‍ය පරීක්ෂණයෙන් අසමත් වූවන් ප්‍රතික්ෂේප කරනු ලැබේ. වෛද්‍ය පරීක්ෂණය පොලිස් රෝහලේ ප්‍රධාන වෛද්‍ය නිලධාරියා විසින් වෛද්‍ය පරීක්ෂණයේ වාර්තා සෞඛ්‍ය 169 පෝරමය යටතේ ඉදිරිපත් කරන අතර, වෛද්‍ය පරීක්ෂණය සඳහා පෙනී සිටිය හැක්කේ එක් වරක් පමණි.

07. *පසුබිම් පරීක්ෂණය* :

(අ) අයදුම්කාරියන්ගේ යහපත් චරිතය තහවුරු කර ගැනීම සඳහා ඇය හා ඇයගේ සමීප ඥාතීන්ගේ ද, ඇය ඇසුරු කරන්නන්ගේ ද යහපත් චරිතය හා හැසිරීම සම්බන්ධව පරීක්ෂණ පවත්වනු ලබන අතර, අයහපත් පසුබිම් වාර්තා සහිත අයදුම්කාරියන් බඳවා ගනු නොලැබේ.

(ආ) බඳවා ගැනීමේ දී අයදුම්කාරියන් විසින් අසත්‍ය තොරතුරු සැපයීම හා තොරතුරු වසන් කිරීම ඇය බඳවා ගැනීමට නුසුදුසුකමක් වේ. අසත්‍ය තොරතුරු සැපයූ බව හා තොරතුරු වසන් කළ බව බඳවා ගැනීමෙන් පසුව හෙළිවුවහොත් සේවයෙන් ඉවත් කරනු ලැබේ.

08. *රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම* :

- රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය විසින්, 2007.04.28 වැනි දින නිකුත් කර ඇති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 07/2007 අනුව 2007.07.01 වැනි දින සිට රාජ්‍ය සේවයට/පළාත් රාජ්‍ය සේවයට බඳවා ගනු ලබන සියලු ම නිලධාරීන්/නිලධාරිනියන් සේවයට බැඳුණු රාජ්‍ය භාෂාවට අතිරේක වශයෙන් අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳව ප්‍රවීණතාවක් සේවයට බැඳී වසර 05 ක් තුළ ලබා ගත යුතු ය.
- 2007.07.01 වැනි දින සිට ශ්‍රී ලංකා පොලිස් සේවයට බඳවා ගනු ලබන සහකාර පොලිස් අධිකාරි තනතුරට පහළ තනතුරු දරන නිලධාරීන් රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව මගින් පවත්වන ද්විතීයික කුසලතා මට්ටමේ භාෂා පාඨමාලා පරීක්ෂණයෙන් සමත් විය යුතු ය.
- පත්වීමේ දින සිට වසර 05 ක් තුළ නියමිත දෙවන භාෂා ප්‍රවීණතාව ලබා නොගන්නා නිලධාරීන්/නිලධාරිනියන්ගේ වැටුප් වර්ධක, සුදුසුකම් ලබා ගන්නා තෙක් විලම්භනය කරනු ඇත.

09. *පත්වීමේ කොන්දේසි* :

❖ මෙම පත්වීම ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතු ය.

10. *සේවා කොන්දේසි* :

(අ) පත්වීම තුන් අවුරුදු ආධුනික කාල පරිච්ඡේදයකට යටත් වනු ඇත.

(ආ) බඳවා ගනු ලබන නිළධාරියන් රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා ද, දැනටමත් සම්පාදිතව පවත්නා හෝ මින් මතු සම්පාදනය කරනු ලබන කිසියම් නියෝගයක් වෙතොත් ඒවාට ද අනුකූලව කටයුතු කළ යුතු ය.

(ඇ) ඔවුහු ආයතන සංග්‍රහයේ පළමුවැනි සහ දෙවැනි වෙළුමේ අඩංගු නියෝග යන්ට ද, මුදල් රෙගුලාසි, පොලිස් නියෝග සහ පොලිස්පතිවරයා විසින් හෝ රජය විසින් හෝ කලින් කලට නිකුත් කරනු ලබන වෙනත් කිසියම් නියෝගයක් වෙතොත් ඒවාට ද යටත් විය යුතු ය.

(ඈ) තනතුර ස්ථිර කිරීමට පෙර සෑම නිලධාරිනියක්ම ශ්‍රී ලංකා පොලීසිය විසින් පවත්වනු ලබන නියමිත පරීක්ෂණවලින් සමත් විය යුතු වේ. නියමිත පරීක්ෂණයන්ගෙන් සමත්වීමට අපොහොසත් වන්නවුන් හෝ පොලිස් රාජකාරි කටයුතු සඳහා නුසුදුසු යැයි නිගමනය කරනු ලබන අයවළුන් ද සේවයෙන් ඉවත් කිරීමට ඉඩ ඇත.

(ඉ) පත්කර ගනු ලැබූ නිලධාරිනියන්ට පොලිස්පතිගේ විශේෂ අවසරය නොමැතිව ඔවුන්ගේ තනතුරෙහි ස්ථිර වනතුරු විවාහ වීමට අවසර දෙනු නොලැබේ. එසේ වුව ද 1973 පෙබරවාරි මස 28 දාතමින් පොලිස් *ගැසට්* II අංක 41 දරන නිවේදනය අනුව හා 2006.10.19 වැනි දින පොලිස්පති චක්‍රලේඛ අංක 1952/2006 අනුව හා 2007.08.09 වැනි දින එම චක්‍රලේඛයේ සංශෝධනය අනුව විශේෂ හේතූන් මත පොලිස්පතිගේ අවසරය ඇතිව විවාහ වීමට හැකියාව ඇත.

(ඊ) අයදුම්කාරියන් පත්කර ගනු ලැබ පුහුණුවෙන් පසු අවුරුදු 03 ක ආධුනික සේවා කාලයක් ශ්‍රී ලංකා පොලීසියේ සේවය කළ යුතු වන අතර, මෙම ආධුනික සේවා කාලය අවසන් වීමට පෙර ඔවුන් ඉල්ලා අස්වීමට කැමැත්තේ නම් ඇයගේ පුහුණුව සඳහා නිල ඇඳුම් ආදිය සම්බන්ධයෙන් දරන්නට සිදු වූ අනෙකුත් වියදම්, ඉල්ලා අස්වීමේ ලිපිය භාර දෙන අවස්ථාවේදී ම නියම කරන ලද මුදලක් ගෙවීමට කැමැත්ත පළ කිරීමේ ගිවිසුමක් ඔවුන් විසින් අත්සන් කළ යුතු ය. මෙම ගෙවීම ශ්‍රී ලංකා පොලිස් විද්‍යාලයේ අධ්‍යක්ෂ විසින් ගණන් බලා තීරණය කරනු ඇත. ඉල්ලා අස්වීම භාර ගැනීම සම්බන්ධයෙන් 1985 හි 1 වැනි වෙළුමෙහි ආයතන සංග්‍රහයේ 5 වැනි පරිච්ඡේදයේ වගන්ති 04 ට අනුකූල විය යුතු ය.

(උ) ආධුනික කාන්තා පොලිස් කොස්තාපල්වරියන්, පුහුණුව ආරම්භ කළ වහාම පොලිස්පති චක්‍රලේඛ අංක 1693/2003 අනුව පොලිස් ආචාර ධර්ම සංග්‍රහයට අනුකූලව ක්‍රියා කරන බවට ප්‍රතිඥා/දිවුරුම් දිය යුතු ය.

(ඌ) ආධුනික කාන්තා පොලිස් කොස්තාපල්වරියන්, පුහුණුව ආරම්භ කළ වහාම පොලිස්පති චක්‍රලේඛ අංක 1804/2004 අනුව අභිමානවත් රාජ්‍ය සේවයකට කැපවීමේ ස්වයං ප්‍රතිඥාව දිය යුතු ය.

(එ) ආධුනික කාන්තා පොලිස් කොස්තාපල්වරියන්, සේවය ස්ථිර කිරීමෙන් පසු ශ්‍රී ලංකා පොලීසියේ අනුමත උසස් කිරීමේ පරිපාටිවලට අනුකූලව උසස් කිරීම සඳහා අවකාශ තිබේ.

11. (අ) මෙම *ගැසට් පත්‍රයේ* I කොටස (II අ) වැනි ඡේදයේ ආරම්භයේ පළ කරන ලද රාජ්‍ය සේවා තනතුරුවලට පත්කිරීම් සම්බන්ධයෙන් අදාළ වන පොදු කොන්දේසි බලපානු ඇත.

(ආ) 1990.03.10 වැනි දින අංක 15/90 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ පරිදි බඳවා ගැනීම් සිදු කරනු ලැබේ.

12. අයදුම්කාරියන් පහත දැක්වෙන ලිපි ලේඛනවල පිටපත් ස්වකීය අයදුම්පත්‍රවලට අමුණා එවිය යුතු ය. (මුල් ලිපි ඉදිරිපත් නොකළ යුතු ය.) :-
(අ) උප්පැන්න සහතිකය,
(ආ) චරිතය පිළිබඳව මෑතක දී ලබාගත් සහතික දෙකක්, (ඥාතීන් නොවන),
(ඇ) අධ්‍යාපන සුදුසුකම් සනාථ කිරීම සඳහා වූ සහතික,
(ඈ) විශේෂ වාර්තා සහිත ක්‍රීඩා පිළිබඳ සහතික හෝ විෂය බාහිර කටයුතු සම්බන්ධයෙන් ලබාගත් සහතික,
(ඉ) සේවා පළපුරුද්ද සම්බන්ධ සහතික, (තිබේ නම් පමණක්),
(ඊ) ජාතික හැඳුනුම්පතෙහි ඡායා පිටපතක්.

13. (අ) දැනටමත් රාජ්‍ය සේවයෙහි නියුතුව සිටින අයදුම්කාරියන් ඔවුන්ගේ අයදුම්පත් අදාළ ආයතන ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතු ය. අයදුම්කාරිය තෝරාගන්නා ලද්දේ නම් ඇය නිදහස් කළ හැකි බවට සහතිකයක් අමුණා එවිය යුතු ය.

(ආ) අයදුම්කාරිය විසින් අයදුම්පත් අඟල් 11 x 8 ප්‍රමාණයේ කඩදාසිවල ස්වකීය අත් අකුරුවලින් ම සම්පූර්ණ කර අදාළ සහතික පිටපත් සමග ඉහත දෙවන ඡේදයේ දක්වා ඇති ලිපිනයට ලැබෙන සේ එවිය යුතු අතර, කුමන හෝ හේතුවක් නිසාවත් එය කිසියම් නිලධාරියකු වෙත පෞද්ගලිකව භාර නොදිය යුතු ය.

14. මෙම නිවේදනයෙහි දක්වා ඇති අවශ්‍යතාවයන් සෑම අයුරකින් ම සනාථ නොකරන අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරෙනු ඇත. එබඳු අයදුම්කාරියන්ට ඒ සම්බන්ධයෙන් පිළිතුරු එවනු නොලැබේ.

*සටහන.—* පරීක්ෂණ හා සම්මුඛ පරීක්ෂණවලට කැඳවනු ලබන අයදුම්කරුකාරියන්ට ගමන් වියදම් හෝ අනෙකුත් වියදම් කිසිවක් ශ්‍රී ලංකා පොලීසිය විසින් ගෙවනු නොලැබේ.

පොලිස්පති.

| කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා 2″ x 2 1/2″ ප්‍රමාණය |
|---|

**ශ්‍රී ලංකා පොලීසිය**

ආධුනික කාන්තා පොලිස් කොස්තාපල් තනතුර
(රාජ්‍ය බුද්ධි සේවාව)

ආදර්ශ අයදුම්පත්‍රය

01. (අ) සම්පූර්ණ නම :———.
(පැහැදිලි ලොකු අකුරෙන්) උප්පැන්න සහතිකයේ සඳහන් කර ඇති පරිදිම විය යුතුය.
(ආ) නම (මුලකුරු සමග) :———.
(ඇ) අයදුම්කරන තනතුර :———.

02. ජාතික හැඳුනුම්පත් අංකය :———.
(ජාතික හැඳුනුම්පතේ ඡායා පිටපතක් අමුණා එවිය යුතුය.)

03. පියාගේ සම්පූර්ණ නම :———.

04. අයදුම්කාරිය උපන් ස්ථානය :———.
උපන් ස්ථානයට අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය :———. පළාත :———.

05. (අ) වර්තමාන ලිපිනය :———.
(ආ) වර්තමාන ලිපිනයට අදාළ පොලිස් ස්ථානය :———.
(ඇ) ස්ථිර ලිපිනය :———.
(ඈ) ස්ථිර ලිපිනයට අදාළ පොලිස් ස්ථානය :———.
(ඉ) ස්ථිර ලිපිනයට අදාළ ග්‍රාම නිලධාරි වසම :———.
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය :———.
(ඊ) ලිපි හුවමාරු කළ යුතු ලිපිනය :———.
(උ) දුරකතන අංකය : නිවස :———. ජංගම :———.

06. (අ) ජන වර්ගය :———.
(ආ) ඔබ ශ්‍රී ලංකා පුරවැසියකු වූයේ පරම්පරාවෙන් ද ? නැතහොත් ලියාපදිංචි කිරීමෙන් ද ? (ලියාපදිංචි වීමෙන් නම් එම සහතිකයේ පිටපතක් අමුණන්න) :———.
(ඇ) ඔබ පුරවැසියකු වූයේ පරම්පරාවෙන් නම් උපන් ස්ථානය :———.
* අයදුම්කාරිය :———.
* අයදුම්කාරියගේ පියා :———.
* අයදුම්කාරියගේ පිය පාර්ශවයේ මුත්තා :———.
* අයදුම්කාරියගේ පිය පාර්ශවයේ මී මුත්තා :———.

07. උපන් දිනය :———. (උප්පැන්න සහතිකයේ ඡායා පිටපතක් ඇමිණිය යුතුයි)
වයස : (*ගැසට්* නිවේදනය අනුව අයදුම්පත් භාරගන්නා අවසන් දිනට)
අවුරුදු :———. මාස :———. දින :———.

08. උස : අඩි :———. අඟල් :———.

09. අධ්‍යාපන සුදුසුකම් : (සමත් වී ඇති විභාගයන් සඳහන් කර සහතිකවල පිටපත් අමුණා එවිය යුතුය) :———.

10. අතිරේක සුදුසුකම් :———. (සහතිකපත්වල ඡායා පිටපත් ඇමිණිය යුතුය)

11. විවාහක/අවිවාහක බව :———.

12. (අ) දැනට කරන රැකියාව :———.
(ආ) ඔබ සන්නද්ධ සේවාවක සාමාජිකාවක් ද ? :———.

13. ඔබට විශේෂ දක්ෂතාවයන් හෝ සුදුසුකම් තිබේ ද ? :———.

14. අයදුම්කාරිය ගැන විමසුම් කළ හැකි ඥාතීන් නොවන දෙදෙනෙකුගේ නම් සහ ලිපිනයන් :
(අ) ———.
(ආ) ———.

15. ඔබ මීට පෙර ශ්‍රී ලංකා පොලීසියේ, සේවය කර තිබේ ද ? :———.
තනතුර සහ නිල අංකය :———.
එසේ නම් ඔබ තනතුරින් ඉවත් වූ හේතු සඳහන් කරන්න. :———.

16. (අ) ඔබ සන්නද්ධ සේවයක සේවය කරන්නේ ද? එසේ නම් අයදුම්පත අදාළ හමුදා ප්‍රධානියාගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. :———.
(ආ) ඔබ සන්නද්ධ සේවාවක සේවය කර ඇත් ද ? එසේ නම් අස්වීමේ දී දෙන සහතිකයේ ඡායා පිටපතක් අමුණන්න :———.

| 181. | 81981/4/7 | | හිස් වීදුරු බෝතල් 3000 ක් පමණ තොගයක් |
| 182. | AR 1114/4/16 | PR 154/12 | 74" x 42 " x 1 " කැටයම් සහිත උලුවහු දොර |
| 183. | 93042/03 | PR 1007/18 | ඉරූ දව ලෑලි (කොස් ) 04<br>ඉරූදව ලෑලි (මහෝගනි) 04 |
| 184. | බී/9560/03/07<br>බී 699/03/08) | | 207 - 3446 දරන ත්‍රිරෝද රථය (අබලි) |
| 185. | බී 64/06<br>(බී 8740/03/07) | | 200-0622 දරන ත්‍රිරෝද රථය (අබලි) |
| 186. | 42922/03/15<br>(42920/03/15) | පී. ආර්. 42/15 | SPBBS 6480 දරන යතුරු පැදිය |

06-811

---

**මගේ අංකය : ති. ම. අධි./න. භා./වෙන්දේසි 2019**

**දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය - තිස්සමහාරාමය**

තිස්සමහාරාම දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩුවලට අදල රාජසන්තක කරන ලද හා මෙතෙක් හිමිකම් නොකියන ලද වෙන්දේසි කිරීමට නියම කරන ලද මෙහි පහත උපලේඛනයේ සඳහන් ද්‍රව්‍යයන් 2019.07.21 වැනි දින පෙ.ව. 10.00 ට අධිකරණ භූමියේ දී වෙන්දේසියේ විකුණනු ලැබේ.

02. මෙහි පහත උපලේඛනයේ සඳහන් කිසියම් භාණ්ඩයක් පිළිබඳව හිමිකම් දක්වන්නෙකු වේ නම් වෙන්දේසිය පැවැත්වීමට නියමිත දින වෙන්දේසිය ආරම්භ කිරීමට පෙර ස්වකීය හිමිකම් ඉදිරිපත් කළ යුතු ය.

03. වෙන්දේසිය ආරම්භ කිරීමට පෙර රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය ලබා වෙන්දේසියේ විකිණීමට නියමිත ද්‍රව්‍යයන් පරීක්ෂා කර බැලිය හැකිය. එය එදින පෙ. ව. 9.30 සිට පෙ. ව. 10.00 දක්වා පමණි.

04. අධිකරණය විසින් නියම කරනු ලද අවම ලංසුව නොපිළිගන්නා අවස්ථාවේ දී අධිකරණයේ අභිමතය පරිදි එම ද්‍රව්‍යයන් වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ අයිතිය අධිකරණය සතුව පවතී.

05. වෙන්දේසියේ දි මිල දී ගන්නා ලද ද්‍රව්‍යයන් සඳහා එම අවස්ථාවේ දී ම මුදල් ගෙවිය යුතු අතර, එවලේ ම අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු ය. සියලුම් ගෙවීම් මුදලින් කළ යුතු අතර චෙක්පත් මුදල් ඇනවුම් ආදිය කිසිසේත් භාරගනු නොලැබේ.

06. වෙන්දේසියේ දී භාණ්ඩ මිලදී ගන්නන් විසින් තමන්ගේ අනන්‍යතාවය ජාතික හැඳුනුම්පත හෝ එ හා සමාන පිළිගත හැකි ලියවිල්ලකින් තහවුරු කළ යුතු ය.

07. මිලදී ගන්නා ලද වැලි හා පස් අධිකරණ භූමියේ සිට ප්‍රවාහනය සඳහා භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය මගින් බලපත්‍ර ලබාගත යුතු යි.

කාංචනා පෙරේරා,
දිසා විනිසුරු/මහෙස්ත්‍රාත්,
දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය,
තිස්සමහාරාමය.

2019 ජුනි මස 07 වැනි දින,
තිස්සමහාරාමය,
දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

**උපලේඛනය**

| අනු. අංකය | නඩු අංකය | භාණ්ඩ විස්තරය | ප්‍රමාණය |
|---|---|---|---|
| 01. | 53061 | සවල් | 01 |
| 02. | 51382 | කැති | 01 |
| 03. | 49816 | ලීමිට සහිත උදළු | 01 |
| | | ගැරුම් වට්ටි ලොකු | 01 |
| | | ගැරුම් වට්ටි පොඩි | 01 |
| | | ඉල්ලම් කූරු | 01 |
| 04. | 52389 | උදළු | 02 |
| | | පොරව | 01 |
| 05. | 49408 | ගැරුම් වට්ටි ලොකු | 01 |
| | | ගැරුම් වට්ටි පොඩි | 01 |
| | | උදළු | 01 |
| 06. | AR 1308/18 | කළු පාට හෙල්මට් | 01 |
| | | පටිය කැඩී ගිය අත් ඔරලෝසු | 01 |
| 07. | 50096 | සවල් | 01 |
| 08. | 50462 | සවල් | 01 |
| | | උදළු | 01 |
| 09. | 50636 | මේෂන් හැදි | 03 |
| | | ලඹ | 01 |
| | | මට්ටම් ලී | 01 |
| 10. | 50637 | කුලු ගෙඩි | 01 |
| 11. | 50219 | දුඹුරු පැහැති ප්ලාස්ටික් පුටු | 04 |
| 12. | 50099 | අඬු මිටි | 01 |
| | | ග්‍රයින්ඩර් | 01 |
| | | මීටර් ටේප් | 01 |
| | | මුළු මට්ටම් | 01 |
| 13. | 43238 | සවල් | 01 |

# තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම්

**නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය - අනුරාධපුර**

රා තැබෑරුම් රේන්ද විකිණීම - 2020 වර්ෂය

2020 වර්ෂයට පහත දැක්වෙන තැබෑරුමේ පැසුණු රා විකිණීම සඳහා ටෙන්ඩර්පත්‍ර පහත සඳහන් කොන්දේසිවලට යටත් ව භාරගනු ලැබේ :-

(i) 1982 අගෝස්තු මස 20 වැනි දින අංක 207 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* සඳහන රා රේන්ද විකිණීමේ කොන්දේසි,

(ii) සියලු සුරාබදු නීතිය යටතේ දැනට බලපවත්වන සාමාන්‍ය කොන්දේසි.

02. මෙම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබා ගන්නා ලද ටෙන්ඩර් ආකෘති පත්‍රයක ලියන ලද සෑම ටෙන්ඩර් පතක් ම රු. 2,000 ක මුදලක් ගෙවා නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයෙන් ලබාගත් කුවිතාන්සියක් සමග ඉදිරිපත් කළ යුතු ය.

03. සාර්ථක වූ ටෙන්ඩර්කරුවන් විසින් ඔහුගේ ටෙන්ඩර් පත්‍රය සමග ඔවුන්ට අයත් නිශ්චල දේපළවල වටිනාකම් සහතිකයක් ප්‍රාදේශීය මහලේකම් තැනගෙන් ලබාගෙන ඇමිණිය යුතු ය. එය තැබෑරුමට ඉල්ලුම් කරන ටෙන්ඩර් මුදලේ වටිනාකමින් සියයට පහළොවකට (15%) නොඅඩු සහතිකයක් විය යුතු ය. මෙම ඡේදයේ සඳහන්වන සහතිකයට අදාළ නිශ්චල දේපළ මෙකී රේන්ද කාලය තුළ දී විකිණීමට හෝ පැවරීමට තහනම් වන්නේ ය. මෙය කඩ කරන අයගේ ගිවිසුම අවලංගු වූවා සේ සැලකේ.

04. සෑම ටෙන්ඩර් පතක් ම සීල් තබන ලද කවරයක බහා එහි වම්පස ඉහළ කෙළවරේ ''2020 වර්ෂය සඳහා අනුරාධපුර නැගෙනහිර නුවරගම් පළාත රා තැබෑරුම සඳහා ටෙන්ඩර් පත්‍රය'' යනුවෙන් සඳහන් කර 2019 අගෝස්තු මස 02 වැනි දින පෙරවරු 10.30 ට පෙර අනුරාධපුර නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට දැමිය යුතු ය. ටෙන්ඩර් පත්‍ර තැපෑලෙන් එවන්නේ නම් ඒවා ලියාපදිංචි තැපෑලෙන් ඉහත සඳහන් පරිදි එවිය යුතු ය. 2019.08.02 වැනි දින පෙ. ව. 10.30 ට ටෙන්ඩරය විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් අයදුම්කරුවන් අදාළ දින නියමිත වේලාවට නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතු ය.

05. සාර්ථක වූ ටෙන්ඩර්කරුට ඔහුගේ ටෙන්ඩර් පත්‍රය පිළිගත් බව දැන්වූ විට රේන්ද විකිණීමේ කොන්දේසිවලට අත්සන් කර ප්‍රාදේශීය ලේකම් විසින් ඇප තැන්පත් මුදල් වශයෙන් නියම කරනු ලබන මුදල මුදලින් ගෙවිය යුතු ය.

06. සාර්ථක වූ ටෙන්ඩර්කරුට ඔහුගේ ටෙන්ඩර් පත්‍රය පිළිගත් බව දැන් වූ විට රේන්ද විකිණීමේ කොන්දේසිවලට අත්සන් කිරීම හෝ නියම කළ ඇප මුදල් තැන්පත් කිරීම පැහැර හැරියහොත් හෝ ඔහු විසින් තැන්පත් කරන ලද ටෙන්ඩර් තැන්පත් මුදල අහිමි වූ බව ප්‍රකාශ කරනවාත් හැර එය පැහැර හරින්නාගේ නම සියලු සුරාබදු බලපත්‍රවලට අදාළ පැහැර හරින්නන්ගේ නාම ලේඛනයට ඇතුළත් කරනු ලැබේ. ජයග්‍රාහී ටෙන්ඩර්කරු විසින් රේන්ද විකිණීමේ කොන්දේසි අත්සන් තැබීමෙන් හා නියමිත ඇප මුදල තැන්පත් කිරීමෙන් පසු සියලුම ටෙන්ඩර්කරුවන්ගේ තැන්පත් මුදල ආපසු ගෙවනු ලැබේ.

07. ටෙන්ඩර් පත්‍රයක් හෝ සියලු ම ටෙන්ඩර්පත්‍ර කිසිම හේතුවක් නොදන්වා ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය ප්‍රාදේශීය ලේකම් වෙත පැවරී ඇත.

08. අනුමත කරන ලද තැබෑරුම් ලැයිස්තුව පහත දැක්වේ :-

| *අනු. අංකය* | *කොට්ඨාසය* | *තැබෑරුම පිහිටුවිය යුතු ප්‍රදේශය හා කොටස* | *තැබෑරුම විවෘත කරන වේලාව* |
|---|---|---|---|
| 01 | අනුරාධපුරය | අනුරාධපුර නව නගරයේ නගර සීමාව තුළ | පෙ. ව. 11.00 සිට ප. ව. 2.00 දක්වා<br>ප. ව. 5.00 සිට ප. ව. 8.00 දක්වා |

09. තනි බලයලත් පුද්ගලයා විසින් එහි අට (08) වැනි ඡේදයේ සඳහන් ප්‍රාදේශීය ලේකම් විසින් වෙන් කර දී ඇති ප්‍රාදේශීය පෙදෙසේ ගොඩනැගිල්ලක් සකස් කළ යුතු ය. සාර්ථක ටෙන්ඩර්කරු විසින් යෝජිත ස්ථානයක් සපයාගත යුතු ය. ප්‍රාදේශීය ලේකම්ගේ අනුමැතිය ලබාගෙන මිස තැබෑරුම වෙනත් ස්ථානයක විවෘත නොකළ යුතු අතර, එසේ කිරීමට ගතයුතු අනුමැතිය බලය ලැබීමේ අනුමැතිය ආරම්භ වීමට දින 14 කට පෙර ප්‍රාදේශීය ලේකම්ගෙන් ලබාගත යුතු ය.

10. රා තැබෑරුම පවත්වාගෙන යන ගොඩනැගිල්ල කිසියම් රජයේ ආයතනයකට, සංස්ථාවකට හෝ පළාත් පාලන ආයතනයකට අයත් වන විට රේන්දයට අදාළ සම්පූර්ණ කාලයට එම ගොඩනැගිල්ල වෙනුවෙන් අදාළ ආයතනයට බද්ද ගෙවා ඒ බැව් ගිවිසුමේ අත්සන් කිරීමට පෙර සනාථ කළ යුතු ය.

11. මේ සම්බන්ධයෙන් විස්තර නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත යුතු ය.

12. **වැදගත් .**- 2019.08.02 වැනි දින රා රේන්ද විකිණීමට නොහැකි වුවහොත් 2019.09.19 වැනි දින පෙරවරු 10.30 ට නැවත විකුණනු ලැබේ.

ඊ. එම්. ආර්. පී. බී. ඒකනායක,
ප්‍රාදේශීය ලේකම්,
නැගෙනහිර නුවරගම් පළාත,
අනුරාධපුර.

2019 ජුනි මස 12 වැනි දින.

06-838

---

**ලුණුගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ රා තැබෑරුම් රේන්ද විකිණීම - 2020 වර්ෂය**

2020 වර්ෂයේ ජනවාරි 01 වැනි දින සිට 2020 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා කාලය තුළ පහත සඳහන් උපලේඛනයේ දක්වා ඇති ලුණුගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ රා තැබෑරුම්වල පැසුණු රා සිල්ලරට විකිණීමේ සම්පූර්ණ වරප්‍රසාද මිල දී ගැනීම සඳහා 1982 අගෝස්තු මස 20 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 207 දරන ගැසට් පත්‍රයේ පළකරන ලද රා විකිණීමේ කොන්දේසිවලට ද යටත්ව 2019.08.07 වැනි දින පෙ.ව. 10.30 දක්වා මා විසින් ටෙන්ඩර්පත් කැඳවනු ලැබේ.

02. රා රේන්දය ලබාගැනීමට ඉදිරිපත් වන අය ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් ලබාගත හැකි නියමිත ටෙන්ඩර් ආකෘති පත්‍රයක් නිසියාකාරව සම්පූර්ණ කර මෙහි පහත දක්වා ඇති අනුමත රා තැබෑරුම් ලැයිස්තුවෙන් නියම කර ඇති ටෙන්ඩර් මුදල ගෙවා ලබාගත් වත්කම් සහතිකයක් ද, සහිතව මුද්‍රා තබන ලද කවරයක බහා වම් පස ඉහළ කෙළවරේ තමන් ටෙන්ඩර් කරනු ලබන රා තැබෑරුමේ අංකය හා නම ද පැහැදිලිව ලියා ඒ ඒ තැබෑරුම් සඳහා මෙහි දැක්වෙන ටෙන්ඩර් භාර ගැනීමේ අවසන් වේලාවට පෙර ලියාපදිංචි කරන ලද තැපෑලෙන් එවීමෙන් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කිරීමෙන් ලුණුගල ප්‍රාදේශීය ලේකම්ට ලැබෙන්නට සැළැස්විය යුතු ය.

03. ටෙන්ඩර්කරුවන් විසින් ටෙන්ඩර්පත්‍ර සම්පූර්ණ කිරීමේ දී ටෙන්ඩර් පත්‍රවල කරනු ලබන සෑම වෙනස් කිරීමක් ම ටෙන්ඩර්කරුවන් සම්පූර්ණ අත්සන් යෙදීමෙන් සනාථ කළ යුතු ය. එසේ නොවන ටෙන්ඩර්පත් භාරගනු නොලැබේ.

04. ටෙන්ඩර් භාර ගන්නා අවසාන දිනය වන 2019.08.07 වැනි දින පෙ.ව. 10.30 ට සියලුම ටෙන්ඩර්කරුවන් මෙම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතු ය.

05. කිසියම් කරුණක් සටහන් නොකළ ටෙන්ඩර් පත්‍රිකාවක් හෝ පත්‍රිකා සියල්ලම ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය ලුණුගල ප්‍රාදේශීය ලේකම් සතු ය.

06. පූර්වෝක්ත දින විකිණීමට නොහැකි වූ රා තැබෑරුම් නැවත විකිණීම 2019.10.18 වැනි දින පෙ.ව. 10.30 ට සිදුකරනු ලැබේ. එදින ටෙන්ඩර්පත් ඉදිරිපත් කිරීම මෙම ගැසට් නිවේදනයේ සඳහන් අවශ්‍යතාවයන්ට අනුකූල විය යුතු ය.

07. තනි වරප්‍රසාද මිලදීගත් තැනැත්තා යයි ප්‍රකාශයට පත් කිරීමෙන් අනතුරුව එසේ ප්‍රකාශ කළ දින එනම් රේන්ද විකුණූ දින ප.ව. 2.00 ට පෙර ලුණුගල ප්‍රාදේශීය ලේකම් විසින් නියම කරනු ලබන මුදල වන මාස දෙකක මුදල් කොටසට වැඩි කොටසක් ඇප තැන්පත් වශයෙන් මා වෙත ගෙවා තැබෑරුම් පිළිබඳ කොන්දේසිවලට අත්සන් කළ යුතුය.

08. ටෙන්ඩර් ඉදිරිපත් කිරීමේ දී දැනගත යුතු වෙනත් විස්තර ඇත්නම් ඒවා ලුණුගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැකි වේ.

ඩී. එම්. එල්. එච්. දිසානායක,
ප්‍රාදේශීය ලේකම්,
ලුණුගල.

2019 ජුනි මස 12 වැනි දින,
ලුණුගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

උපලේඛනය

**2020 වර්ෂය සඳහා අනුමත කරන ලද රා තැබෑරුම් ලැයිස්තුව**

**ලුණුගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය - 2020.01.01 වැනි දින සිට 2020.12.31 වැනි දින දක්වා**

| අනුක්‍රමික අංකය | තැබෑරුමේ නම සහ අංකය | කොට්ඨාසය | තැබෑරුම් පිහිටුවිය යුතු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | තැබෑරුම විවෘත කළ යුතු වේලාව | තැබෑරුම වැසිය යුතු වේලාව | ටෙන්ඩර් තැන්පත් | ටෙන්ඩර් භාර ගැනීමේ අවසාන දිනය සහ වේලාව |
|---|---|---|---|---|---|---|---|
| 01 | ලුණුගල අංක 02 | ලුණුගල | ලුණුගල ප්‍රාදේශීය සභාවේ කොට්ඨාස අංක 02 හි වරිපනම් අංක 219 දරන කුරුවි කුඹුරු වත්ත | පෙ.ව. 11.00ට<br>ප.ව. 5.00 | ප.ව. 2.00<br>ප.ව. 8.00 | රුපියල් 5,000 | 2019.08.07 පෙ.ව. 10.30 |

මහදෝව වත්තේ සීමාව තුළ 2020 වර්ෂය සඳහා රා කැන්ටින් බලපත්‍රය අලුත් කිරීමට එම වත්තේ වතු අධිකාරි විසින් ඔහුගේ නිර්දේශය 2019.08.07 වැනි දින හෝ එදිනට ප්‍රථම ලැබෙන සේ ලුණුගල ප්‍රාදේශීය ලේකම් වෙත එවිය යුතු ය.

06-938

---

**කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය**

2020 වර්ෂය සඳහා රා තැබෑරුම් විකිණීම

1982 අගෝස්තු මස 20 වැනි දින අංක 207 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ පළකර ඇති 1983 වර්ෂයට හා ඊට පසු කාල පරිච්ඡේදයන් සඳහා වලංගු රා තැබෑරුම් රේන්ද විකිණීමේ කොන්දේසිවලටත්, එම කාලය තුළ දී පවත්නා සෑම සුරාබදු කොන්දේසියකටමත් යටත්ව, 2020 වර්ෂය තුළ දී පහත සඳහන් උපලේඛනයේ දැක්වෙන රා තැබෑරුම්වල සිල්ලරට රා විකිණීමේ තනි අයිතිය මිල දී ගැනීම සඳහා කොත්මලේ ප්‍රාදේශීය ලේකම් විසින් 2019.08.15 වැනි දින පෙ. ව. 10.30 දක්වා ටෙන්ඩර් භාරගනු ලැබේ.

02. (අ) සෑම ටෙන්ඩරයක් ම දිවයිනේ ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් ලබාගත හැකි නියමිත ටෙන්ඩර් පෝරමය විය යුතු ය.

(ආ) ටෙන්ඩර් මුදලක් වශයෙන් ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක පහත උපලේඛනයේ දැක්වෙන ආකාර ටෙන්ඩර් මුදලක් තැන්පත් කර තිල කුවිතාන්සියක් සහ,

(ඇ) ටෙන්ඩර්කරුගේ ඉඩකඩම් ආදී නිශ්චල දේපළ පිහිටි කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම්ගෙන් ලබාගන්නා ලද වත්කම් පිළිබඳ සහතිකයක් ටෙන්ඩරය සමග ඉදිරිපත් කළ යුතු ය. ටෙන්ඩර් සහ වත්කම් සහතික ඉදිරිපත් කිරීම පිළිබඳ යථොක්ථ රා තැබෑරුම් විකිණීමේ කොන්දේසිවල අඩංගු නියමයන් විධිමත් ලෙස පිළිපැදිය යුතු බව ටෙන්ඩර්කරුවන් වෙත නිවේදනය කෙරේ.

(ඈ) ටෙන්ඩර්පත්‍ර සම්පූර්ණ කිරීමේ දී පහත සඳහන් අවශ්‍යතාවයන් කෙරෙහි ද සැලකිලිමත් විය යුතු ය :

*(a)* ටෙන්ඩර්පත්‍ර මුලුමනින් ම සම්පූර්ණ කළ යුතු ය. මෙසේ කිරීමේ දී එහි සඳහන් කෙරෙන ගණන ඉලක්කමෙන් පමණක් නොව අකුරෙන් ද ලිවිය යුතු ය.

*(b)* සම්පූර්ණ කරන ලද ටෙන්ඩර්පත්‍රවල නියමිත සාක්ෂිකරුවන්ගේ සාක්ෂිවලට අමතරව පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ හැඳුනුම්පත් අංක ද යෙදිය යුතු ය.

*(c)* සෑම වෙනස් කිරීමක්/කපා හැරීමක් ටෙන්ඩර්කරුගේ සම්පූර්ණ අත්සන සහ දිනය යෙදීමෙන් සහතික කළ යුතු ය.

*(d)* සෑම ටෙන්ඩර්කරුවෙකුම ටෙන්ඩර් පෝර්මය සමග තම ජාතික හැඳුනුම්පතෙහි සහතික කරන ලද ඡායා පිටපතක් ඉදිරිපත් කළ යුතු ය. මෙම නියමයන්ට පටහැනි ටෙන්ඩර්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

03. විධිමත් ලෙස සම්පූර්ණ කරන ලද ටෙන්ඩර් පත්‍රය ටෙන්ඩර් තැන්පත් මුදල සඳහා ලබා ගන්නා නිල කුවිතාන්සියක් වත්කම් පිළිබඳ සහතිකයත් සමග ලියුම් කවරයක බහා මුද්‍රා තබා කවරයේ වම් පස ඉහළ කෙළවරේ නියමිත තැබෑරුම් අංකය සහ නම'' සඳහන් කර කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ඒ සඳහා තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ ටෙන්ඩර් භාරගැනීම අවසන් වීමට පෙර තැන්පත් කළ යුතු ය. ටෙන්ඩර් පත්‍රය තැපෑලෙන් එවන්නේ නම්, ටෙන්ඩර් භාරගැනීමේ වේලාව ඉකුත් වීමට පෙර ''ප්‍රාදේශීය ලේකම්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, කොත්මලේ යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

04. ටෙන්ඩර් භාරගැනීමේ අවසන් වේලාව පහත උපලේඛනයේ දැක්වේ. එකී වේලාවට ටෙන්ඩර්කරුවන් කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතු ය.

05. ඕනෑම ටෙන්ඩරයක් භාරගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීමේ බලය මා සතුය.

06. තෝරාගත් ටෙන්ඩර්කරු, ගැණුම්කරු ලෙස ප්‍රකාශයට පත් කළ වහාම, එදින ප. ව. 2.00 ට පෙර, ඇප තැන්පත් මුදල වශයෙන් කොත්මලේ ප්‍රාදේශීය ලේකම් විසින් නියම කරනු ලැබිය හැකි වාරික තුනකට නොඅඩු මුදලක් ඇප තැන්පත් වශයෙන් කොත්මලේ ප්‍රාදේශීය ලේකම් වෙත තැන්පත් කළ යුතු ය. එම මුදල මා නමින් පුණ්ඩළුඔය මහජන බැංකුවේ වර්ෂයක ස්ථාවර තැන්පත් ගිණුමක රඳවා තැබීමට රේන්දකරුවන් එකඟ විය යුතු ය. මෙම තැන්පතුව මුදලින් හෝ බැංකුවක් විසින් ගෙවීම සඳහා ද යන්න සඳහන් කරන ලද චෙක්පතකින් හෝ ලංකා බැංකුවෙන් හෝ මහජන බැංකුවෙන් ආරක්ෂිත චෙක්පත් ස්වරූපයෙන් ගෙවිය යුතු ය.

07. අවශ්‍ය මුද්දර ආදිය ඉදිරිපත් කොට කොන්දේසි මාලාවට සහ කොන්ත්‍රාත්තුවට ටෙන්ඩර්කරු අත්සන් තැබිය යුතු ය.

08. පොරොන්දු වන ටෙන්ඩර් මුදල වාරික වශයෙන් මුදලින් පමණක් ගෙවිය හැකි අය ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතු ය.

09. කිසියම් ටෙන්ඩරයක් කිහිප දෙනෙකු විසින් හවුලේ ඉදිරිපත් කරනු ලබන්නේ නම්, ඒ එක් එක් අයවලුන්ගේ පෞද්ගලික ලිපිනයන් වෙන වෙනම පැහැදිලිව දැක්විය යුතු ය.

10. යම් රා තැබෑරුමක් මෙදින විකුණනු නොලැබුවහොත් 2019.09.26 වැනි දින පෙ. ව. 10.30 ට මෙම ස්ථානයේ දී ම විකුණනු ලැබේ.

11. මෙම ටෙන්ඩරය විකිණීම සම්බන්ධයෙන් මාගේ තීරණය අවසාන තීරණය වේ.

12. රේන්ද විකිණීම හා අදාළ කොන්දේසි සහ වෙනත් වැඩි විස්තර කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් විමසා ලබා ගත හැකි ය.

ඕ. එස්. පෙරේරා,
ප්‍රාදේශීය ලේකම්.
කොත්මලේ.

2019 ජුනි මස 12 වැනි දින,
කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

| *අංකය හා තැබෑරුමේ නම* | *තැබෑරුම පිහිටි ස්ථානය* | *ටෙන්ඩර් භාරගැනීම අවසන් වේලාව* | *ටෙන්ඩර් තැන්පත් මුදල (රු.)* |
|---|---|---|---|
| රා තැබෑරුම් : | | | |
| අංක 1 - කඩදොරපිටිය | කඩදොරපිටිය ග්‍රාමය තුළ | 2019.08.15 පෙ. ව. 10.30 | 5,000 |
| අංක 2 - ඕතලාව | තෝරාගනු ලබන ස්ථානයකට කොත්මලේ ප්‍රාදේශීය ලේකම්ගේ අනුමැතිය ලබාගත් ලිපියක් ඉදිරිපත් කළ යුතු ය | 2019.08.15 පෙ. ව. 10.30 | 5,000 |
| අංක 3- කටුකිතුල | කටුකිතුල ග්‍රාමය තුළ | 2019.08.15 පෙ. ව. 10.30 | 5,000 |

06-939/1

# රජයේ නොවන දැන්වීම්

**දැන්වීමයි**

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ පහත සඳහන් සමාගම සංස්ථාපනය කළ බවට කරනු ලබන නිවේදනයයි.

නම : ස්නෝ(ව්)ඩ්රොප් (පීවීටී) එල්ටීඩී
ලියාපදිංචි අංකය : පීවී 00210379
ලියාපදිංචි ලිපිනය : 23/16, ද අල්විස් මාවත, ගල්කිස්ස.

සමාගම් ලේකම්.

2019 ජුනි මස 10 වැනි දින.

06-699

---

**දැන්වීමයි**

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ පහත සඳහන් සමාගම් සංස්ථාපනය කළ බවට කරනු ලබන නිවේදනයයි.

1. නම : බියුටි ඩයට් (පී වී ටී) එල් ටී ඩී
   ලියාපදිංචි අංකය : පී වී 00205334
   ලියාපදිංචි ලිපිනය : 23/16, ද අල්විස් මාවත, ගල්කිස්ස

2. නම : පබ්ලිස් ලෙජන්ඩ්ස් (පීවීටී) එල්ටීඩී
   ලියාපදිංචි අංකය : පීවී 00205591
   ලියාපදිංචි ලිපිනය : 23/16, ද අල්විස් මාවත, ගල්කිස්ස.

සමාගම් ලේකම්.

2019 ජුනි 10 වැනි දින.

06-700

---

**නිවේදනයයි**

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ පහත සඳහන් සමාගම සංස්ථාපනය කළ බවට කරනු ලබන නිවේදනයයි.

සමාගමේ නම : ඩී සී මැනේජ්මන්ට් ඇන්ඩ් කොමර්ෂල් සර්විසස් (පීවීටී) එල්ටීඩී
ලියාපදිංචි අංකය : පීවී 002112222
ලියාපදිංචි කළ දිනය : 2019 ජුනි 01 වැනි දින
ලියාපදිංචි ලිපිනය : නො. 82/20, සුහද මාවත, මහල්වරාව, පන්නිපිටිය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියෝගය පරිදි,

සමාගමේ ලේකම්.

06-722

---

**2007 අංක 7 දරන සමාගමේ පනතේ 9 (1) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි**

සමාගමේ නම : මායාසර්ට් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී. වී. 00212083
දිනය : 2019.05.27
ලියාපදිංචි අංකය : අංක 94/20, බොරැල්ල පාර, දෙපානම, පන්නිපිටිය
සමාගමේ ලේකම් : සී. මැතිව් සහ කො. (පුද්ගලික) සමාගම
එස්. ඊ. සී./(2) 2013/311

06-725

---

**දැන්වීමයි**

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වන වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම 2019 මැයි මස 23 දින සංස්ථාගත කරන ලදී.

සමාගමේ නම : ඉනොවේටිව් සෙකියුරිටි සොලූෂන්ස් (පීවීටී) එල්ටීඩී
සමාගමේ අංකය : පී. වී. 00211953
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : නො. 385/3, ''මීනා'' කෝට්ටේ පාර, කෝට්ටේ

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

බිස්නස් සොලුෂන්ස් ඇන්ඩ් සෙකට්‍රීස් (පුද්ගලික) සමාගම.

06-727

---

**දැන්වීමයි**

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වන වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම 2019 මැයි මස 25 දින සංස්ථාගත කරන ලදී.

සමාගමේ නම : කැපිටල් කෝර්ප් ඉන්ටර්නැෂනල් (පීවීටී) එල්ටීඩී
සමාගමේ අංකය : පී. වී. 00212030
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : නො. 108/3 1/1, ස්ටැන්ලි තිලකරත්න මාවත, නුගේගොඩ

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

බිස්නස් සොලුෂන්ස් ඇන්ඩ් සෙකට්‍රීස් (පුද්ගලික) සමාගම.

06-728

---

**ප්‍රසිද්ධ නිවේදනය**

2007 අංක 07 දරන සමාගම් පනතේ 09 වන වගන්තිය අනුව කරනු ලබන නිවේදනයයි.

සමාගමේ නම : සකුරායි නිහෝන් ග්‍රෘප් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ ලියාපදිංචි අංකය : පී වී 00211136
ලියාපදිංචි කාර්යාලය : නො. 458/04/A, උඩුමුල්ල, මුල්ලේරියාව, අංගොඩ
සංස්ථාගත කළ දිනය : 2019 අප්‍රේල් 17.

සමාගම් ලේකම්වරු.

06-731

---

**සංස්ථාගත කිරීමක් පිළිබඳ ප්‍රසිද්ධ නිවේදනය**

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ නිවේදනයයි.

සමාගමේ නම : ඇකඩමි ෆො ප්‍රොෆෙෂනල් ස්ටඩීස් ඇන්ඩ් කන්සල්ටන්සි සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 00212109
සංස්ථාගත කිරීමේ දිනය : 2019 මැයි 28
ලියාපදිංචි කාර්යාලය : නො. 138/10, පළවෙනි පටුමග, ජයගත් මාවත, හෝකන්දර උතුර.

සී. එච්. සෙනෙවිරත්න,
නො. 06, නිලානි උද්‍යානය,
බෝකුන්දර, පිළියන්දල.

06-734

---

**සංස්ථාගත කිරීමක් පිළිබඳ ප්‍රසිද්ධ නිවේදනය**

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තියට අනුගාමීවයි

සමාගමේ නම : එනර්ත් හෝල්ඩිංස් (පීවීටී) එල්ටීඩී
ලියාපදිංචි අංකය : පී වී 00212474
ලියාපදිංචි ලිපිනය : 298 - 4/1, ආර් ඒ ද මැල් මාවත, කොළඹ 03
ඉදිරිපත් කිරීම : අධ්‍යක්ෂක මණ්ඩලයේ අණ පරිදි

එච්. ටී. පී බිස්නස් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්.

06-740

---

**ඇටර්නි බලපත්‍ර අවලංගු කිරීමයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ කොළඹ 13, කොටහේන බොන්ජීන් පාර නො. 57 ඒ යන ලිපිනයේ ලියාපදිංචි ද ගුඩ්විල් මැරයින් ඇකඩමි (පුද්.) සමාගම වන අප විසින් අපගේ නීත්‍යානුකූල ඇටර්නි බලකරු ලෙස එකී ජනරජයේ මාරවිල මුඩුකටුව ලෙ ෆෙවරිටා මාවත හි පදිංචි විජේසිංහ ආරච්චිගේ චන්ද්‍රරත්න හේමකුමාර (ජා. හැ. අංක 620472255 V) යන අය පත් කරමින් නො. 93, ඉම්පීරියල් ඩ්‍රයිව් හැරොව් මිඩ්ල්සෙක්ස් HA 27DX එක්සත් ජනපදයේ පදිංචි සී බාලචන්දිරන් සහ නො. 177 කින්ග්ස්ලි පාර හෙයින් ස්ලොව් Jw3 4A5 එක්සත් ජනපදයේ පදිංචි ටී සිවනඩරාජා යන සාක්ෂිකරුවන් ඉදිරියේ 2008.10.11 වැනි දින ලියා සහතික කරන ලද හා බත්තරමුල්ල රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ ඇටර්නි බලපත්‍ර පොතේ 7/109 පත්තිරුව යටතේ 4036 දින පොත් යටතේ 2008.10.30 වැනි දිනැතිව ලියාපදිංචි කරන ලද ඇටර්නි බලපත්‍රය මින් අවලංගු කරන බව ද මින් ඉදිරියට ඉහත ඇටර්නි බලකරුගේ ක්‍රියාවලට මම වගනොකියන බව ද දන්වා සිටිමි

ද ගුඩ්විල් මැරයින් (පුද්.) සමාගම,
ඇටර්නි අධිපති.

06-743

---

**සමාගමේ නම වෙනස් කිරීම**

2007 අංක 7 දරන සමාගම් පනතේ 9(1) වන වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගමේ නම වෙනස් කරන ලදී.

සමාගමේ පෙර නාමය : ස්කයිලින්ක් කෝපරේට් සර්විසස් (පීවීටී) ලිමිටඩ්
ලියාපදිංචි දිනය : 2018 දෙසැම්බර් 13
සමාගමේ අංකය : පී. වී. 125812
සමාගමේ නව නාමය : ඩී එස් එච් කෝපරේට් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 236/12, වේළුවන පාර, කොළඹ 09

අධ්‍යක්ෂ මණ්ඩලය.

06-798

---

**දැන්වීමයි**

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වන වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම 2018 නොවැම්බර් මස 15 වැනි දින සංස්ථාගත කරන ලදී.

සමාගමේ නම : අන්බොක්ස් සොලූෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී. වී. 00206368
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : නො. 8/16, ශ්‍රී සිද්ධාර්ථ පාර්ක්, කිරුලපන, කොළඹ 05.

සමාගම් ලේකම්.

06-799

---

**නිවේදනයයි**

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තියේ ප්‍රකාරව පහත සඳහන් සමාගම සංස්ථාගත කරන ලදී.

සමාගම් නාමය : සස්ටේනබල් කම්පියුටිං රිසර්ච් ග්‍රෘප් ස්කෝර්
සමාගම් අංකය : ජී. ඒ. 00209781
ලියාපදිංචි ලිපිනය : නො. 96/12, මාඹුල්ගොඩ, පන්නිපිටිය, හෝමාගම 10230

රොෂාණි තුෂාරා කපුගෙදර,
සමාගම් ලේකම්.

06-801

---

**දැන්වීමයි**

වර්ෂ 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වැනි වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම් සංස්ථාපිත කළ බවට මෙයින් දන්වමු.

සමාගමේ නම : එල්. ඒ. එම්. සමරවීර ඇන්ඩ් කම්පැනි (පීවීටී) එල්ටීඩී
ලියාපදිංචි අංකය : පීවී 00212273
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : නොතාරිස් වලව්ව, පොල්වත්ත, දෙණිපිටිය, වැලිගම
ලියාපදිංචි දිනය : 2019.06.02

සමාගමේ නම : සොහා ලංකා ටෙක්නොලොජීස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පීවී 00210931
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : නො. 349/3, හුබුටියාව, නිට්ටඹුව
ලියාපදිංචි දිනය : 2019.04.09

සමාගමේ නම : සුපීරියර් සොලූෂන්ස් බී පී ඕ (පීවීටී) එල්ටීඩී
ලියාපදිංචි අංකය : පී වී 00208363
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : නො. 594, නුවර පාර, බුළුගහ හංදිය, කැලණිය
ලියාපදිංචි දිනය : 2019.02.01

සමාගමේ නම : සිනැක් ලංකා ඉංජිනියරින් (පීවීටී) එල්ටීඩී
ලියාපදිංචි අංකය : පීවී 00210919
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : නො. 198, ශාන්ත ජෝසප් වීදිය, මීගමුව
ලියාපදිංචි දිනය : 2019.04.09

සමාගමේ නම : ටෙකෙප් ඉන්ටර්නැෂනල් (පීවීටී) එල්ටීඩී
ලියාපදිංචි අංකය : පී වී 00207900
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : නො. 288/19, සිරිනන්ද ජෝතිකාරාම පාර, තලවතුගොඩ.
ලියාපදිංචි දිනය : 2019.01.11

සමාගමේ නම : ක්ලීන්ටෙක් එනර්ජි (පීවීටී) එල්ටීඩී
ලියාපදිංචි අංකය : පී වී 00209294
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : නො. 37, සුධර්මාරාම පාර, මොරටුව

ලියාපදිංචි දිනය : 2019.02.27

සමාගමේ නම : ඩිලක්ස් හෝල්ඩිංස් (පීවීටී) එල්ටීඩී
ලියාපදිංචි අංකය : පී වී 00207235
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : නො. 175, වඳුරාමුල්ල වත්ත, පානදුර
ලියාපදිංචි දිනය : 2018.12.17

සමාගමේ නම : එච්. ආර්. එඩියුකේෂන් ඇන්ඩ් වීසා කන්සල්ටන්ස් (පීවීටී) එල්ටීඩී
ලියාපදිංචි අංකය : පී වී 00207798
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : නො. 218/1, අළුත්ම වත්ත පාර, කොළඹ 15
ලියාපදිංචි දිනය : 2019.01.09

සමාගමේ නම : ලිමාස් ඉන්ටර්නැෂනල් (පීවීටී) එල්ටීඩී
ලියාපදිංචි අංකය : පී වී 00207712
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : නො. 594/19, සමන් මාවත, හෝමාගම
ලියාපදිංචි දිනය : 2019.01.05

සමාගමේ නම : මාදන් ලංකා මිනරල්ස් (පීවීටී) එල්ටීඩී
ලියාපදිංචි අංකය : පී වී 00207810
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : නො. 311/ඊ, ගොඩමුදුන්න, මුරුතලාව, මහනුවර
ලියාපදිංචි දිනය : 2019.01.09

සමාගමේ නම : මිකරල් ආර්වේදික් හර්බල්ස් (පීවීටී) එල්ටීඩී
ලියාපදිංචි අංකය : පී වී 00210814
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : නො. 37, සුධර්මාරාම පාර, කටුබැද්ද, මොරටුව
ලියාපදිංචි දිනය : 2019.04.06

සමාගමේ නම : නිර්මාණහෝම්ස් ඇන්ඩ් ඩිසයින්ස් (පීවීටී) එල්ටීඩී
ලියාපදිංචි අංකය : පී. වී. 00207708
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : නො. 165/48, දූව පාර, බටගම උතුර, ජා-ඇල
ලියාපදිංචි දිනය : 2019.01.04

සමාගමේ නම : එන්. ඉසෙඩ්. ඕ. ලීඩ්ස් (පීවීටී) එල්ටීඩී
ලියාපදිංචි අංකය : පී. වී. 00211353
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : නො. 242/9, සමිදු පාර, එඬේරමුල්ල, වත්තල
ලියාපදිංචි දිනය : 2019.05.02

සමාගමේ නම : රෙයිවා (පීවීටී) එල්ටීඩී
ලියාපදිංචි අංකය : පී වී 00211181
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : නො. 05, මේජර් ගුණරත්න මාවත, ගල්කිස්ස
ලියාපදිංචි දිනය : 2019.04.18

සමාගමේ නම : රොන්ස් රියල් එස්ටේට් කම්පැනි (පීවීටී) එල්ටීඩී
ලියාපදිංචි අංකය : පී. වී. 00207622
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : නො. 411/15, පරාක්‍රම මාවත, කිරිල්ලවල, කඩවත
ලියාපදිංචි දිනය : 2019.01.02

සමාගමේ නම : රෝස්මෙරි රෙස්ටුරන්ට් ඇන්ඩ් කේටර්ස් (පීවීටී) එල්ටීඩී
ලියාපදිංචි අංකය : පී. වී. 00211357
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : ''තාරුක් සෙවණ'' උරුලෑවත්ත, වට්ටප්පොල
ලියාපදිංචි දිනය : 2019.05.02

සමාගමේ නම : සට්වා (පීවීටී) එල්ටීඩී
ලියාපදිංචි අංකය : පී. වී. 00210854
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : නො.190/5, පොල්හේන මුහුදු පාර, පොල්හේන, මාදිහා, මාතර
ලියාපදිංචි දිනය : 2019.04.06

(ඉහත සඳහන් සමාගම් හි ලේකම්වරු)

06 - 818

---

**දැන්වීමයි**

වර්ෂ 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වන වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම සංස්ථාපිත කළ බවට මෙයින් දන්වමු.

සමාගමේ නම : සී ෂෙල්ස් බීච් රිසෝර්ට් (පීවීටී) එල්ටීඩී
ලියාපදිංචි අංකය : පීවී 00207192
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : කුම්පූරුපිඩ්ඩි නැගෙනහිර, කුම්පූරුපිඩ්ඩි, කුච්චවේලි, ත්‍රිකුණාමලය
ලියාපදිංචි දිනය : 2018.12.14

(ඉහත සඳහන් සමාගමේ ලේකම්වරු)

06-819

---

**දැන්වීමයි**

වර්ෂ 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වන වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම සංස්ථාපිත කළ බවට මෙයින් දන්වමු.

සමාගමේ නම : යෙහාස් යෙනුක කම්පැනි(ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පීවී 00207149
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : නො. 430/2, අහුගම්මන, දෙල්ගොඩ
ලියාපදිංචි දිනය : 2018.12.13

(ඉහත සඳහන් සමාගමේ ලේකම්වරු)

06-820

---

**දැන්වීමයි**

වර්ෂ 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වන වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම සංස්ථාපිත කළ බවට මෙයින් දන්වමු.

සමාගමේ නම : ඉන්ටෙල් සෝලාර් (පීවීටී) එල්ටීඩී
ලියාපදිංචි අංකය : පීවී 00210558
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : නො 475 බී, හයිලෙවල් පාර, විජේරාම, නුගේගොඩ, මහරගම
ලියාපදිංචි දිනය : 2019.03.31

(ඉහත සඳහන් සමාගමේ ලේකම්වරු)

06-821

---

**ප්‍රසිද්ධ දැන්වීමයි**

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (2) වගන්තිය ප්‍රකාරව ජර්මනිෂර් ලොයිඩ් කළම්බු (ප්‍රයිවට්) ලිමිටඩ් ඉහත සඳහන් පනතේ 8 වන වගන්තියේ ප්‍රතිපාදනයන්ට අනුකූලව එහි නාමය 2019 මැයි මස 30 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි ඩී එන් වී ජී එල් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් ලෙස වෙනස් කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සමාගමේ පෙර පැවති නාමය : ජර්මනිෂර් ලොයිඩ් කළම්බු (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 7251
ලියාපදිංචි කාර්යාලය : 3 වන මහල, උතුරු කොටස, සයරු සෙවන ගොඩනැගිල්ල, නො. 46/12, නවම් මාවත, කොළඹ 02
සමාගමේ නව නාමය : ඩී එන් වී ජී එල් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

කෝපරේට් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්වරු,
ඩී එන් වී ජී එල් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්.

06-823

---

### ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (2) වගන්තිය ප්‍රකාරව අයෝනික්ස් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් ඉහත සඳහන් පනතේ 8 වන වගන්තියේ ප්‍රතිපාදනයන්ට අනුකූලව එහි නාමය 2019 මැයි මස 27 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි ඔටෝනෙටික් (ප්‍රයිවට්) ලිමිටඩ් ලෙස වෙනස් කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සමාගමේ පෙර පැවති නාමය : අයොනික්ස් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 110262
ලියාපදිංචි කාර්යාලය : 10 බී 1, ටවර් 3, 320 යුනියන් පෙදෙස, කොළඹ 02
සමාගමේ නව නාමය : ඔටෝනෙටික් (ප්‍රයිවට්) ලිමිටඩ්

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රධාන විධායක නිලධාරි,
කෝපරේට් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්වරු,
ඔටෝනෙටික් (ප්‍රයිවට්) ලිමිටඩ්.

06-824

### ඇටෝර්නි බලය අහෝසි කිරීම

බොරලන්ද වංගියකුඹුර ''ආසිරි නිවස'' දරන ස්ථානයේ පදිංචි ජා. හැ. අ. 193930710016 හිමි විජේසේකර මුදියන්සේලාගේ විජේසේකර වන මා විසින් ලුණුවත්ත, ලකීලෑන්ඩ් වත්ත, සාම විහාරය දරන ස්ථානයේ පදිංචි වංගියකුඹුරේ විමලජෝති හිමි යන අය වැලිමඩ ප්‍රසිද්ධ නොතාරිස් ඒ. ජේ. පී. එච්. බී. එම්. ආර්. සේනක බණ්ඩාර මහතා විසින් ලියා සහතික කරන ලද අංක 730 සහ 2018.09.09 වැනි දින දරන රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව, ඌව සබරගමුව කලාප කාර්යාලය, 22 වැනි කාණ්ඩය, 188 වෙනි පත්ඉරුව, අංක 1671 යටතේ ලියාපදිංචි ඇටෝර්නි බලපත්‍රය වර්ෂ 2019 ක් වූ ජුනි මස 02 වැනි දින පටන් අවලංගු කර ප්‍රත්‍යාදිෂ්ඨ කර අහෝසි කළ බව මෙයින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත්, මහ ජනතාවටත් දනුම් දෙයි.

විජේසේකර මුදියන්සේලාගේ විජේසේකර,

2019ක් වූ ජුනි මස 02 වැනි දින දී ය.
''ආසිරි නිවස'', වංගියකුඹුර, බොරලන්ද.

06-848

---

### ඇටෝර්නි බලය අවලංගු කිරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වැල්ලවත්ත, රොක්සි ගාර්ඩන්ස් හි අංක 480/152 හි පදිංචි රජීව් දිල්ෂාන් පෙරේරා (ජා. හැ. අංක 682453923 V) වන මා ජනතාවට ප්‍රකාශකර සිටින්නේ එක්සත් රාජධානියේ (20, Fenchurch Street, London, EC3M 3BY, UK ලිපිනයේ) ලියාපදිංචි කාර්යාලය පවත්වාගෙන යනු ලබන බ්‍රිතාන්‍ය සමාගම් පනත (English Companies Acts - 1985 to 1989) යටතේ සංස්ථාගත කොට ලියාපදිංචි කොට ඇති චාර්ටර්ඩ් ඉන්ස්ටිටියුට් ෆෝ සිකියුරිටීස් ඇන්ඩ් ඉන්වෙස්ට්මන්ට් (සර්විසස්) ලිමිටඩ් යන සමාගම විසින් මා වෙත ප්‍රදනය කරන ලද රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ ඇටෝර්නි බලපත්‍ර ලේඛනයේ වෙළුම 180, පත්ඉරුව 54 හා දිනපොත් අංකය 14433 යටතේ 2016.10.17 දිනැතිව ලියාපදිංචි කොට ඇති ඇටෝර්නි බලපත්‍රය මෙතැන් පටන් ශුන්‍ය, අවලංගු හා බලරහිත වන අතර, මින් පසු රජීව් දිල්ෂාන් පෙරේරා වන මා විසින් කරනු ලබන කිසිම ක්‍රියාවකට ඉහත සමාගම වගකීමක් නොදරන බවයි.

රජීව් දිල්ෂාන් පෙරේරා.

06-933

---

### ඇටෝර්නි බලය අවලංගු කිරීම ප්‍රත්‍යාදිෂ්ඨ කිරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ බුත්පිටිය, දොරණාදිවෙල, අංක 377/05 දරන ස්ථානයේ පදිංචි ජාතික හැඳුනුම්පත් අංක 596542476 V හිමි වීරකොන්ඩ බදුගේ අනුලාවතී වන මම, නුවරඑළිය ප්‍රසිද්ධ නොතාරිස් එච්. පී. ඩී. නානායක්කාර මහතා විසින් වර්ෂ 2007ක් වූ අප්‍රේල් මස 07 වැනි දින ලියා සහතික කළ අංක 2697 දරන විශේෂ ඇටෝර්නි බලපත්‍රය මගින් එකී ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මධ්‍යම පළාතේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, කඳපොල, ජයලංකා, අංක 37 දරන ස්ථානයේ පදිංචි ජාතික හැඳුනුම්පත් අංක 763170594 V හිමි වැලිගම තුප්පහිගේ උදාර ප්‍රියන්ත නමැති අයට ලබා දුන් විශේෂ ඇටර්නි බලය මෙයින් ප්‍රත්‍යාදිෂ්ඨ කොට අවලංගු කරනු ලැබූ බව ශ්‍රී ලංකා රජයත් සියලු මහජනතාවත් මෙයින් දැන ගනිත්වා.

එකී විශේෂ ඇටෝර්නි බලපත්‍රයේ නම සඳහන් ඇටර්නි බලකරු විසින් මෙදිනෙන් පසු මා වෙනුවෙන් කරනු ලබන ක්‍රියාවන් හෝ ගනුදෙනු සම්බන්ධයෙන් මා විසින් කිසිදු වගකීමක් භාරගනු නොලබන බව ද සියලු දෙනාම මෙයින් දැනගනිත්වා.

වීරකොන්ඩ බදුගේ අනුලාවතී.

06-965

---

## වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

### නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පී.එල්.සී.

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමේ නිවේදනය

නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පී. එල්. සී. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මා වෙත පවරා ඇති බලතල ප්‍රකාරව කොළඹ 13 සිය ලියාපදිංචි කාර්යාලය පිහිටි CEY T PRODUCES (Private) Limited යන අය බන්ධනදායි/උකස්කරු වශයෙන් නැෂනල් ඩිවෙලොප්මන්ට් බැන්ක් පී එල් සී වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට උකස් කර ඇති පහත විස්තර කර ඇති දේපල 2019ක් වූ ජූලි මස 22 වැනි දින පෙ. ව. 11.30 ට එම දේපල පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

ඉතා වටිනා සියලු පහසුකම් සහිත ව්‍යාපාරික දේපලක් බදුල්ල දිස්ත්‍රික්කයේ බණ්ඩාරවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය හා ප්‍රාදේශීය සභා සීමාවන් තුළ අංක 70 ඩී ලියනගහවෙලවත්ත ග්‍රාම නිලධාරි කොට්ඨාසය අම්පිටිකන්ද ගමේ පිහිටි බලගල ඇල්ල ටී ෆැක්ටරි ඇන්ඩ් ප්‍රෙමිසස් නමැති ඉඩමට බලයලත් මානක පී බී ඉලංගසිංහ විසින් 2014.05.31 වැනි දින සාදන ලද අංක BD/9316 දරන පිඹුරේ නිරූපිත බෙදාවෙන් කළ ලොට් අංක 01 නමැති ඉඩම් කොටස හා එහි තුළ පිහිටි ගොඩනැගිලි ගහකොළ වගාව ඇතුළු අනෙකුත් සියලු දේ ඉඩමේ ප්‍රමාණය අක්කර 01, රූඩ් 01 පර්චස් 17.87

දේපළට පිවිසීම- බණ්ඩාරවෙල නගරයේ සිට පූනගල පාරේ කි. මී. 10.5ක් පමණ ගමන් ගෙන දකුණට පිහිටි බලගලඇල්ල පාරට හැරී එම පාරේ කි. මී. 1.5ක් පමණ ගිය පසු අදාළ දේපළ මෙම පාරට මායිම්ව පාරේ වම් පසින් පිහිටා තිබේ.

යෝජනා සම්මුතිය සඳහා 2019.06.14 වැනි දින රජයේ ගැසට් පත්‍රය ද , 2019.05.30 වැනි දින ''දිවයින'', ''අයිලන්ඩ්'' සහ ''තිනක්කුරල්'' පුවත්පත් ද බලන්න.

ගෙවීමේ ක්‍රමය .- මිල තීන්දු වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතු ය :

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක (සියයට එකක) විකුණුම් බදු,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මිලෙන් 2 1/2% (සියයට දෙකහමාරක්),
4. සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය,
5. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 1,000.00,
6. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු. 2000.00,

ගැණුම් මිලෙන් 90% ක් වූ ඉතිරිය ද, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අයබදු හෝ ගාස්තු අයකිරීම් ද වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30 ක් ඇතුළත ගෙවිය යුතු වේ.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න : කළමනාකරු මධ්‍යගත (අයකිරීම් අංශය) නැෂනල් ඩිවෙලොප්මන්ට් බැන්ක් පී. එල්. සී. අංක 40, නවම් මාවත, කොළඹ 02.

දුරකථන අංකය : 011 2 448 448.

අයි. ඩබ්ලිව්. ජයසූරිය,
අධිකරණ හා වාණිජ බැංකු
පිළිගත් වෙන්දේසිකරු.

අංක. 369/1, දුටුගැමුණු මාවත,
ලේවැල්ල පාර, මාවිල්මඩ මහනුවර,
දුරකථන අංක : 081-2210595/ 071-8446374/071-4962449.

06-844

---

HNB 292 -18.

### හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. - දෙනියාය ශාඛාව
(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

මොරවක ප්‍රසිද්ධ නොතාරිස් ඩී. ඩී. අබේවික්‍රම විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. නමට ලියන ලද්දාවූ ද 2013 ජූලි මස 24 වැනි දින සහතික කළ අංක 2726 සහ 2014 නොවැම්බර් මස 27 වැනි දින සහතික කළ අංක 3231 දරන බැඳුම්කරයන් යටතේ අය විය යුතු මුදල් ගෙවීම වික්‍රමසිංහ ගුණසේකර අජිත් සරත් කුමාර සහ තම්මිටිය ගොඩගේ කුසුමාවතී යන අය ණයකරුවන් ලෙස පැහැර හැර ඇති හෙයින්, හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. විසින් මා වෙත පවරා ඇති බලතල අනුව අයවිය යුතු ණය මුදල් සියලු ස්ථාපිත ගෙවීම් හා වෙන්දේසි කරුගේ ගාස්තු ඇතුළුව සියලුම මුදල් අයකර ගැනීම පිණිස පහත සඳහන් දේපළ 2019ක් වූ ජූලි මස 23 වැනි දින පෙ. ව. 10.30 ට එම දේපල පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

උපලේඛනය

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ මොරවක් කෝරළේ කොටපොළ ප්‍රාදේශීය සභා සීමාව තුළ සහ කොටපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ උසමලගොඩ ග්‍රාම නිලධාරි වසමේ කොටපොල හි පිහිටි එගොඩවත්තහේන නමැති ඉඩමට සර්වේයර් ජෙනරාල් විසින් 1917 ජුනි 28 වැනි දින මැන සාදන ලද අංක 325752 (B. S. Sup. Sheet 0 10/5058/F. B. No. 23960) දරන පිඹුරෙන් බෙදාවෙන් කරන ලද ලොට් අංක 127 වශයෙන් දක්වෙන ඉඩම් කොටස ප්‍රමාණයෙන් අක්කර හයයි රූඩ් තුනයි පර්චස් දහඅටක (අ. 6, රූ. 3 පර්. 18) විශාලත්වයෙන් වූ ඉඩම සමග පස සහ එහි පිහිටි සියලුම දේත් සමග වේ.

බලයලත් මිනින්දෝරු ඒ. ජේ. ජයසේකර විසින් 2013 අප්‍රේල් මස 30 දින සාදන ලද අංක 87/2013 දරන පිඹුරෙන් බෙදාවෙන් කරන ලද ඉහත සඳහන් ඉඩම් කොටස නැවත මැන දක්වා ඇත.

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2018.08.24 වැනි දින රජයේ ගැසට් පත්‍රය ද, 2018.09.04 වැනි දින ''ලක්බිම'', ''තිනකුරල්'' සහ ''ඩේලිමිරර්'' පුවත්පත් ද බලන්න.

ඉඩමට පිවිසීම.- අකුරැස්ස දෙනියාය පාරේ කි. මී. 1/2ක් පමණ කොටපොල හන්දිය දක්වා බෝදෙනිය පාර තෙක් ගමන් කරන්න. එතැනින් මෙම පාරේ තවත් කිලෝමීටරයක් පමණ ගමන් කරන්න. අදාළ දේපළ එම පාරේ වම් අත පැත්තේ පිහිටා ඇත.

ගෙවීමේ ක්‍රමය .- වෙන්දේසිය අවසානයේ උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතු ය.

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්),
2. ප්‍රාදේශීය සභා බදු සඳහා සියයට එකක් (1%)ක් ද,
3. වෙන්දේසිකරුගේ වෘත්තිමය ගාස්තු,
4. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු රුපියල් දෙදහක් (රු. 2,000)ක් ද,
5. ලිපිකරුගේ හා සෝෂක ගාස්තු රුපියල් දාහක් (රු. 1,000) ක් ද,
6. සියලුම ප්‍රචාරක වියදම් ද වේ.

ගැණුම් මුදලින් ඉතිරි සියයට 90% ක් වූ මුදල විකිණීමේ දින සිට දින 30ක් ඇතුළත හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සි වෙත ගෙවිය යුතු ය. දින 30ක් ඇතුළත ඉතිරි මුදල නොගෙවුවහොත් ගෙවා ඇති සියයට දහයක (10%) මුදල අහිමි කිරීමට සහ දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාළ ඔප්පු හා ලියවිලි පරීක්ෂාව සහ වෙනත් තොරතුරු ජ්‍යෙෂ්ඨ කළමණාකරු : (ණය අධීක්ෂණ සහ අය කිරීම්) හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10.

දුරකථන අංක : 266 1866, 2661828 ගෙන් ලබාගත හැක.

පියරත්න මුතුකුමාරණ,
(මුළු දිවයිනට ම සාම විනිසුරු)
උසාවි කොමසාරිස් තක්සේරුකරු හා බලයලත් වෙන්දේසිකරු.

අංක 56, අතිපූජ්‍ය මඩිහේ නාහිමි මාවත,
මහරගම.
දුරකථන අංක : 0777 - 378441/0714 424478.
ෆැක්ස් අංකය : 0112 509442.

06-893

---

HNB 314 -19

### හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. - කඩවත ශාඛාව
(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ අගනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

රත්නපුර ප්‍රසිද්ධ නොතාරිස් ආර්. එම්. සී. ආර්. ඩී. රාජපක්ෂ විසින් සහතික කරන ලද්දවූ හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. නමට ලියන ලද්දවූ ද 2014 ජුනි මස 05 වැනි දින සහතික කළ අංක 2915, 2015 පෙබරවාරි මස 23 වැනි දින සහතික කළ අංක 3231 සහ 2015 සැප්තැම්බර් මස 14 වැනි දින සහතික කළ 3444 දරන උකස් බැඳුම්කරයන් යටතේ අය විය යුතු මුදල් ගෙවීම ටිස්ටාර් සිලෝන් (ප්‍රයිවට්) ලිමිටඩ් යන අය ණයකරු ලෙස පැහැර හැර ඇති හෙයින්, හා මඩප්පුලි ආරච්චිගේ දිල්ෂානි මඩප්පුලි ආරච්චි අධ්‍යක්ෂිකාවක් ලෙස එකී සමාගමේ පාලනය සහ කළමනාකරණය දරන අතර ඒ අනුව එකී මඩප්පුලි ආරච්චිගේ දිල්ෂානි මඩප්පුලි ආරච්චි ටිස්ටාර් සිලෝන් (ප්‍රයිවට්) ලිමිටඩ් වෙත හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී විසින් ප්‍රදනය කළ මුල්‍ය පහසුකමෙහි සැබෑ ප්‍රතිලාභියි වන හෙයින් ද,

එබැවින් ටිස්ටාර් සිලෝන් (ප්‍රයිවට්) ලිමිටඩ් සහ මඩප්පුලි ආරච්චිගේ දිල්ෂානි මඩප්පුලි ආරච්චි හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. වෙත අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින් හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. විසින් මා වෙත පවරා ඇති බලතල අනුව අයවිය යුතු ණය මුදල් සියලු ස්ථාපිත ගෙවීම් හා වෙන්දේසිකරුගේ ගාස්තු ඇතුලුව සියලුම මුදල් අයකර ගැනීම පිණිස පහත සඳහන් දේපළ 2019 ක් වූ ජූලි මස 30 වැනි දින පෙ. ව. 11.30 ට එම දේපළ පිහිටි ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

උපලේඛනය

1. සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, අටකලන් කෝරළේ පන්නිල් පත්තුවේ කහවත්ත ප්‍රාදේශීය සභා සීමාව තුළ කහවත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මඩලගම ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ මඩලගම ගමේ පිහිටි පරමන්ඩියේහේන්යාය සහ හල්ගුලනේහේන නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එල්. යූ. කන්නන්ගර විසින් 1989 ජුනි මස 20 වැනි දින පිළියෙ කරන ලද අංක 3151 දරන පිඹුරෙන් බෙද වෙන් කරන ලද ලොට් ඒ වශයෙන් දක්වෙන ඉඩම් කොටස ප්‍රමාණයෙන් අක්කර දහතරයි රූඩ් එකයි පර්චස් පහක (අ. 14, රූ. 01 පර්. 05) විශාලත්වයෙන් වූ ඉඩම සමග ගොඩනැගිලි සහ එහි පිහිටි අනෙකුත් සියලුම දේත් සමග වේ.

එකී මඩලගම ගමේ පිහිටි පරමන්ඩියේහේන්යාය සහ හල්ගුලනේහේන නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එල්. යූ. කන්නන්ගර විසින් 1989 ජුනි මස 20 වැනි දින පිළියෙල කරන ලද අංක 3151 දරන පිඹුරෙන් බෙද වෙන් කරන ලද ලොට් ඒ නමුත් වඩාත් නිවැරදි ලොට් බී වශයෙන් දක්වෙන ඉඩම් කොටස ප්‍රමාණයෙන් අක්කර පහළොවයි පර්චස් දෙලහක (අ. 15, රූ. 0 පර්. 12) විශාලත්වයෙන් වූ ඉඩම සමග ගොඩනැගිලි සහ එහි පිහිටි අනෙකුත් සියලුම දේත් සමග වේ.

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2019.01.25 වැනි දින රජයේ ගැසට් පත්‍රය ද, 2019.02.06 වැනි දින ''මව්බිම'', ''තිනකුරල්'' සහ ''ඩේලිමිරර්'' පුවත්පත් ද බලන්න.

ඉඩමට පිවිසීම.- කහවත්ත නගර මධ්‍යයේ සිට ඇන්දන පාරේ කි. මී. 12.5ක් පමණ ජනපද හන්දිය දක්වා ගමන් කර මදලගම පාරට දකුණට හැරී තවත් කි. මී. 3ක් පමණ ගිය විට එම ප්‍රවේශ මාර්ගයේ වම් පැත්තේ අදල දේපළ හමුවේ.

ගෙවීමේ ක්‍රමය .- වෙන්දේසිය අවසානයේ උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතු ය.

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්),
2. ප්‍රාදේශීය සභා බදු සඳහා සියයට එකක් (1%)ක් ද,
3. වෙන්දේසිකරුගේ වෘත්තිමය ගාස්තු,
4. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු රුපියල් දෙදහක් (රු. 2,000)ක් ද,
5. ලිපිකරුගේ හා සෝෂක ගාස්තු රුපියල් දාහක් (රු. 1,000) ක් ද,
6. සියලුම ප්‍රචාරක වියදම් ද වේ.

ගැණුම් මුදලින් ඉතිරි සියයට 90% ක් වූ මුදල විකිණීමේ දින සිට දින 30ක් ඇතුළත හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. වෙත ගෙවිය යුතු ය. දින 30ක් ඇතුළත ඉතිරි මුදල නොගෙවුවහොත් ගෙවා ඇති සියයට දහයක (10%) මුදල අහිමි කිරීමට සහ දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදළ ඔප්පු හා ලියවිලි පරීක්ෂාව සහ වෙනත් තොරතුරු ජ්‍යෙෂ්ඨ කළමණාකරු : (ණය අධීක්ෂණ සහ අය කිරීම්) හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10.

දුරකථන අංක : 266 1866, 2661828 ගෙන් ලබාගත හැක.

පියරත්න මුතුකුමාරණ,
(මුළු දිවයිනට ම සාම විනිසුරු)
උසාවි කොමසාරිස් තක්සේරුකරු හා
බලයලත් වෙන්දේසිකරු.

අංක 56, මඩිහේ නාහිමි මාවත,
මහරගම.
දුරකථන අංක : 0777 - 378441/0714 424478
ෆැක්ස් 0112 509442

06-894

---

**කිසියම් හේතුවක් නිසා ගැසට් නිවේදනයක් අවලංගු කරන්නේනම් ඒ බව එම සතියේ සඳුද දිනට පෙර දැනුම් දිය යුතුය.**

I කොටස : (IIආ) ඡේදයේ වෙන්දේසි කිරීම් යටතේ පළවන ඉතිරි දැන්වීම් සහ I කොටස : I ඡේදය යටතේ පළවන සියලු දැන්වීම් 2019.06.28 දින ගැසට් පත්‍රයේ පළවේ.

මුද්‍රණය හා බෙදාහැරීම ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසිනි.
www.documents.gov.lk